# කාර්ය සාධන වාර්තාව
# செயலாற்று அறிக்கை
# PERFORMANCE REPORT
# 2015




ආයුර්වේද දෙපාර්තමේන්තුව

**ஆயுர்வேத திணைக்களம்**

**DEPARTMENT OF AYURVEDA**

# කාර්ය සාධන වාර්තාව

# 2015

ආයුර්වේද දෙපාර්තමේන්තුව

## සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



ශ්‍රී ලාංකික අනන්‍යතාවයෙන් යුත් දේශීය වෛද්‍ය ක්‍රම මත පදනම් වූ රෝග නිවාරණ හා ප්‍රතිකාර සේවා පිළිබඳව දේශීයව මෙන්ම ජාත්‍යන්තරව ද වැඩි අවධානයක් යොමු වී ඇති අවධියක ඒ වෙනුවෙන්ම පිහිටවනු ලැබූ රාජ්‍ය ආයතනය වන ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් එළිදක්වන ලද 2015 වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාව වෙනුවෙන් ප්‍රථමයෙන් මාගේ සුභාශිංසන පිරිනමමි.

1961 වසරේ අංක 31 දරණ පනත යටතේ ස්ථාපිත කරනු ලැබූ ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ශික්ෂණ සහ පර්යේෂණ රෝහල්, පුහුණු ආයතනයක්, පර්යේෂණායතනයක් මෙන්ම දිවයිනේ විවිධ කලාපවල පිහිටි පර්යේෂණ ඔසු උයන්ද පාලනය වන අතර, එමඟින් දේශීය වෙදකම මෙන්ම, ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රමයන්හි අභිවෘද්ධිය සහ චිරස්ථිතිය උදෙසා ඉටුවන මෙහෙය අපමණය.

වර්තමාන ලෝක ප්‍රජාවගෙන් බහුතරයක් විවිධාකාර වූ සෞඛ්‍ය ගැටළු වලට මුහුණ දීම සීඝ්‍රයෙන් සිදු වන අතර වර්තමානයේ සිදුවන මරණ වලින් 70% කට පමණ හේතු වනුයේ බෝ නොවන රෝග වන අතර ඉන් බහුතරයක් පාරිසරික විනාශයන්, නොගැළපෙන ආහාර සහ ජීවන රටාවන් හේතුවෙන් සිදු වේ. කෙසේ වෙතත් එකී හේතූන් විද්‍යාත්මකව තහවුරු වීමෙන් අනතුරුව, මිනිසා නැවතත් සොබා දහම කෙරෙහි නැඹුරු වී ඇත. එහිදී වස විසෙන් තොර ආහාර පරිභෝජනය මෙන්ම, අතුරු ආබාධ අවම වූ වෛද්‍ය ක්‍රමයන් පිළිබඳ විශ්වාසය ද ඉහළ නැංවී ඇත. මේ වන විට බටහිර වෛද්‍ය පර්යේෂකයින් පවා රසායනික ඖෂධ වලට වඩා පැරැන්නන් භාවිතා කළ ස්වාභාවික ශාක සාර ඇසුරු කර ගත් ඖෂධ නූතනයට ගැළපෙන ආකාරයට සකස් කිරීම කෙරෙහි වැඩි උනන්දුවක් දක්වනු පෙනේ. එවන් වූ වකවානුවක දේශීය වෛද්‍ය ක්‍රමයන්හි අභිවෘද්ධිය හා සුරක්ෂිතතාව සම්බන්ධ වගකීම් පැවරී ඇති ප්‍රධානතම ආයතනය වන ආයුර්වේද දෙපාර්තමේන්තුව, සොබාදහම හා බැඳුණු ජීවන හා ආහාර රටාවන්ට මිනිසුන් නැඹුරු කරවීම, රෝග නිවාරණය හා වැළැක්වීම සඳහා වූ සේවා සැපයීම, දේශීය වෛද්‍ය ක්‍රම මත පදනම් වූ අධ්‍යයන හා පර්යේෂණ ක්ෂේත්‍රයන්හි දියුණුව මෙන්ම ශ්‍රී ලංකාවේ ස්වාභාවික ඖෂධ ශාක සංරක්ෂණය හා සුරක්ෂණය පිණිස ද කටයුතු කරමින් සිටී.

2015 වසරේ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් එකී කාර්යයන් ඉටු කිරිමේ ප්‍රගතිය මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇත. ආයුර්වේද දෙපාර්තමේන්තුව සතු මානව හා භෞතික සම්පත් මනාව කළමනාකරණය කරමින් සමස්ත ලක්වැසි ජනතාවගේ යහපත පිණිස කටයුතු කරන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත මාගේ හෘදයංගම ස්තුතිය පිරිනමමි. එසේම එළඹෙන වසරේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති සියලු කාර්යයන් සාර්ථක කර ගැනීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය නොඅඩුව ලැබේවායි ද ප්‍රාර්ථනය කරමි.

**වෛද්‍ය රාජිත සේනාරත්න**
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය

## සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමය වසර 2500ක පමණ ඉතිහාසයකට දිවයන පාරම්පරික සම්ප්‍රදායික දැනුම මත පදනම් වූවකි. සහජීවනය හා සමානාත්මතාවය පාදක කරගත් සමාජමය අවශ්‍යතාවයන් සහතික වන්නා වූ පසුබිමක් නිර්මාණය වී ඇති කාලවකවානුවක ආයුර්වේද දෙපාර්තමේන්තුව 2015 වසර සඳහා වූ තම කාර්ය සාධන වාර්තාව මෙසේ එළි දැක්වීමට පියවර ගෙන ඇත.

ආයුර්වේද දෙපාර්තමේන්තුව, ආයුර්වේද, සිද්ධ, යුනානි සහ පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය, සංවර්ධනය හා අනන්‍යතාවය සුරක්ෂිත කිරීම තුළින් සැමට සුවසෙත ළඟාකර දීම සඳහා ජාතික මට්ටමින් වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම තම මෙහෙවර ලෙස සලකා දිවයින පුරා ප්‍රතිස්ථාපනය කර ඇති ආයුර්වේද රෝහල් පද්ධතිය තුළින් බාහිර රෝගී ප්‍රතිකාර සේවා මෙන්ම බෝ නොවන රෝග විෂයයෙහි වන සායන හරහා විශාල සමාජ මෙහෙවරක නිරත වෙමින් සිටියි. විෂයයෙහි පුහුණු සහ අති දක්ෂ වෛද්‍යවරුන් හා කාර්ය මණ්ඩල බිහි කිරීමේ අරමුණින් පිහිටුවා ඇති දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය මෙන්ම සාහිත්‍ය, ඖෂධ සහ සායනික පර්යේෂණ ඔස්සේ විවිධ රෝග විෂයයෙහි ප්‍රතිකාර පිණිස නව සොයා ගැනීම් එළිදැක්වීමේ අරමුණින් ක්‍රියාත්මක බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය ද, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාක්ෂාත් කරදීම පිණිස විශිෂ්ට සේවා සපයන ඒ යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතන වේ.

ආයුර්වේද දෙපාර්තමේන්තුව, විවිධ දේශගුණික කලාප නියෝජනය වන පරිදි ස්ථාපනය කර ඇති ඔසු උයන් ජාලය ශ්‍රී ලාංකික ජනතාව වෙත ඖෂධීය ශාක හඳුන්වා දෙමින් ඒවා වගා කිරීම මෙන්ම බහුවිධ භාවිතයට හුරු කරවීමේ ප්‍රයත්නයක යෙදී සිටියි. විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන සේ නිර්මාණය වී ඇති කාර්ය මණ්ඩල ව්‍යුහය ද ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන ඉලක්ක වෙත පිවිසීම උදෙසා මනා පිටිවහලක් වී ඇත.

දේශයක අභිවෘද්ධිය උදෙසා රාජ්‍ය ආයතන ව්‍යුහය තුළ වාර්ෂික සැලසුම් සපුරාලීම වෙනුවෙන් නව මානයන් ඔස්සේ විශිෂ්ට වූ මෙහෙවරක නියැළි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව වෙනුවෙන් මාගේ සුභාශිංසන මෙසේ පිරිනමමි. ඉදිරි වර්ෂයේ දී ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ, හෙළ වෙදකම පිළිබඳ නොමැකෙන සලකුණු තැබීමට හැකි කර්තව්‍යයන්හි නියැළෙමින්,ජාත්‍යන්තරය තුළ ජයකෙහෙළි නැංවීමට ආයුර්වේද දෙපාර්තමේන්තුවට අවස්ථාව උදාවේවා යි ප්‍රාර්ථනා කරමි.

**ෆයිසාල් කාසිම්**

සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍ය

## සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ලේකම්තුමාගේ පණිවිඩය



රෝගයක මූල බීජය සොයා ඊට පිළියම් යෙදීමෙන් එය සමනය කරන, එමෙන්ම අතුරු ආබාධ අවම වූ වෛද්‍ය ක්‍රම ලෙස, ජනතාවගේ විශ්වාසයට බඳුන් වූ පාරම්පරික හෙළ වෙදකම මෙන්ම ආයුර්වේද, සිද්ධ හා යුනානි වෛද්‍ය ක්‍රම හඳුන්වා දිය හැකිය. වර්තමානයේ ශ්‍රී ලාංකික ප්‍රජාව තුළ රෝග සුවපත් කිරීම මෙන්ම නිවාරණය උදෙසාද මෙම වෛද්‍ය ක්‍රමයන් මාහැඟි මෙහෙවරක් ඉටු කරනු ලබයි.

අපගේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධ බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය, ශික්ෂණ හා පර්යේෂණ රෝහල් මෙන්ම පර්යේෂණ ඔසු උයන් ආදිය දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ලබාදෙන දායකත්වය අනභිබවනීය වේ. එමෙන්ම කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි නව ආයතන ලෙස වකුගඩු රෝග හා බෝ නොවන රෝග ආදිය පිළිබඳ පර්යේෂණ රෝහල් මෙන්ම, පාරම්පරික වෛද්‍ය ක්‍රම පිළිබඳ පර්යේෂණ රෝහල් පිහිටුවීමේ කටයුතු ද ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ඉටු කරමින් පවතී. තව ද ඉහත කී වෛද්‍ය ක්ෂේත්‍ර යටතට ගැනෙන පෞද්ගලික ආයුර්වේද රෝහල් හා ආයතන නියාමනය කිරීමද ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

මෙම කාර්ය සාධන වාර්තාවේ අන්තර්ගතය වන්නේ, ආයුර්වේද දෙපාර්තමේන්තුව සහ ඊට අනුබද්ධ ආයතන 2015 වසරේ දී අත්පත් කර ගන්නා ලද ප්‍රගතිය පිළිබඳ සංක්ෂිප්තයකි.

දේශීය වෛද්‍ය ක්‍රමය, ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රම සංවර්ධනය හා සංරක්ෂණය සඳහා, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, ආයුර්වේද කොමසාරිස් ප්‍රමුඛ කාර්ය මණ්ඩලය විසින් සිදුකරනු ලබන සේවාව සහ කැප කිරීම ඉතා අගය කොට සලකමි.

**අනුර ජයවික්‍රම**

**ලේකම්**

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

## ආයුර්වේද කොමසාරිස්තුමාගේ පණිවිඩය



ලෝකයේ ඇතැම් රටවල ඒ ඒ රටවලට ආවේණික වූ පාරම්පරික වෛද්‍ය ක්‍රමයන් නූතන වෛද්‍ය ක්‍රම සමඟ භාවිතා වේ. චීනය, කොරියාව, ජර්මනිය, ඉන්දියාව එබඳු පාරම්පරික වෛද්‍ය ක්‍රමයන් භාවිත කෙරෙන රටවල් අතරින් කිහිපයකි. පාරම්පරික වෛද්‍ය ක්‍රමයට ඉදිරියෙන්, අති නවීන බටහිර වෛද්‍ය ක්‍රමය ඒ රටවල භාවිත කෙරුණ ද, පාරම්පරික වෛද්‍ය ක්‍රමයද ඊට සමගාමීව ආරක්ෂා වෙමින් පවතී.

අපේ රටේ තත්ත්වය විශ්ලේෂණය කිරීමේදී බටහිර වෛද්‍ය ක්‍රමය සමඟ දේශීය වෛද්‍ය ක්‍රමයද පාරම්පරික වෛද්‍ය ක්‍රමයද නවීන වෛද්‍ය ක්‍රම වලට නොදෙවෙනි ආකාරයේ ප්‍රතිකාර විධි, සහ රෝග නිවාරණ ක්‍රම වලින් යුතු වීම විශේෂත්වයකි. රටේ අති විශාල පිරිසකගේ සෞඛ්‍ය ගැටළු නිරාකරණය කිරීමට එය යෙදා ගැනේ. එමෙන්ම වසරින් වසර දේශීය වෛද්‍ය ක්‍රමය උදෙසා වෙන් කෙරෙන මුදල් ප්‍රමාණයද ඉහළ යමින් පවතී. එසේ වෙන් කරනු ලබන රජයේ මුදල්, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා උපයෝජනය කර ඇති ආකාරය මෙම කාර්ය සාධන වාර්තාවෙන් විශ්ලේෂණය කෙරේ.

අපගේ ප්‍රධාන සේවාලාභියා රෝගියා වන අතර, ඔවුනගේ අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කෙරිණි. ඒ අනුව 2015 වසරේ වැඩි අවධානයක් යොමු කෙරුණේ වකුගඩු රෝග පාලනය කෙරෙහිය. ඒ අනුව අනුරාධපුරය, මැදවච්චිය කේන්ද්‍ර කර ගනිමින් වකුගඩු රෝග නිවාරණ වැඩසටහන් හා ආයුර්වේද වෛද්‍ය සායන මාලාවක් වසර පුරාවට පවත්වන ලදී. එමෙන්ම වකුගඩු රෝග, බෝ නොවන රෝග නිවාරණය හා ප්‍රතිකාර කටයුතු වෙනුවෙන්ම විශේෂිත රෝහල් දෙකක් අනුරාධපුර මැදවච්චිය සහ අම්පාර නින්දවූර්හි ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතී. වකුගඩු රෝග නිවාරණය සහ පර්යේෂණ සඳහා සැලසුම් කළ මැදවච්චිය රෝහලේ ඉදි කිරීම් කටයුතු මේ වන විට නිම වෙමින් පවතින අතර, බෝ නොවන රෝග පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සඳහා සැලසුම් කළ නින්දවූර් රෝහල ඉදිකිරීමේ කටයුතු ද ඉදිරියේදී ආරම්භ කිරීමට ද නියමිතය.

භෞතික සංවර්ධනයට අමතරව මානව සම්පත දියුණු කිරීම උදෙසා ද, අදාළ කාර්ය මණ්ඩලය විදෙස් ශිෂ්‍යත්ව, පුහුණු වැඩසටහන් සහ පශ්චාත් උපාධි පාඨමාලාවලට යොමු කිරීමට ද එම වසරේ සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කිරීමට හැකියාව ලැබිණ. දිනෙන් දින දියුණු වන ලෝකයේ නවීන කාර්මික හා තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ කාර්යාල කටයුතු කාර්යක්ෂම කිරීමටද හැකියාව ලැබුණු අතර, ඒ පිළිබඳ තොරතුරුද මෙම කාර්ය සාධන වාර්තාවේ ඇතුළත්ය.

මෙම ප්‍රගතිය අත්පත් කර ගැනීම සඳහා අපට මග පෙන්වූ ගරු අමාත්‍යතුමන් නියෝජ්‍ය අමාත්‍යතුමන්, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලය සඳහා කැපවීමෙන් ක්‍රියා කළ දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලයද කෘතවේදීව සිහිපත් කරමි.

**පී.එස්.කේ.ආර්.වීරකෝන්**

ආයුර්වේද කොමසාරිස්

# පටුන


1. ආයුර්වේද දෙපාර්තමේන්තුව .................................................................. 1
   1.1 හැඳින්වීම .................................................................. 1
   1.2 දැක්ම .................................................................. 1
   1.3 මෙහෙවර .................................................................. 1
   1.4 ප්‍රධාන කාර්යයන් .................................................................. 2
   1.5 ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබන ආයතන .................................... 2
   1.6 සාමාන්‍ය පරිපාලනය .................................................................. 3
   1.7 ආයතනික ව්‍යුහය .................................................................. 4
   1.8 මූල්‍ය ප්‍රගතිය - 2015 .................................................................. 5
2. ආයතන හා පාලන අංශය .................................................................. 6 -7
3. සංවර්ධන අංශය .................................................................. 8-15
4. ශිල්පීය අංශය .................................................................. 16-21
5. මූල්‍ය අංශය .................................................................. 22 -23
6. විභාග අංශය .................................................................. 24- 26
7. ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල .............................................. 27-29
8. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල (ශික්ෂණ) - යක්කල .......................... 30 -32
9. සිද්ධ ශික්ෂණ රෝහල - කයිතඩි .................................................. 33 -35
10. ආයුර්වේද රෝහල - මන්වන්තොඩුවායි .............................................. 36
11. ආයුර්වේද රෝහල - අම්පාර .................................................................. 37- 38
12. සිද්ධ ශික්ෂණ රෝහල - ත්‍රිකුණාමලය ................................................ 39
13. බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය - නාවින්න ......... 40 -63
14. චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල - හම්බන්තොට ..................... 64 -66
15. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය ............................................ 67 -73
16. ආයුර්වේද දෙපාර්තමේන්තු ඔසු උයන් ................................................ 74
   16.1 ආයුර්වේද පර්යේෂණායතන ජාතික ඔසු උයන - නාවින්න ................... 75 -76
   16.2 ජාතික පර්යේෂණ ඔසු උයන - හල්දුම්මුල්ල ...................................... 77 - 78
   16.3 පට්ටිපොළ ඔසු උයන .................................................................. 79 -80
   16.4 ගිරාඳුරුකෝට්ටේ ඔසු උයන .......................................................... 81
   16.5 පල්ලේකැලේ ඔසු උයන .............................................................. 82 -83
   16.6 පින්නදූව ඔසු උයන .................................................................. 84- 85
   16.7 කන්නෙලිය ඔසු උයන .................................................................. 86

# 1. ආයුර්වේද දෙපාර්තමේන්තුව

## 1.1 හැඳින්වීම

**1961** අංක **31** දරණ ආයුර්වේද පනත අනුව ස්ථාපිත කර ඇති ආයුර්වේද දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ, දේශීය වෛද්‍ය අංශයේ කාර්ය භාරය ඉටු කිරීමෙහි ලා මූලිකව කටයුතු කරනු ලබන ආයතනය වන්නේය.

ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති පරිපාලන වගකීම් හා කාර්යයන් ඉටු කිරීමෙහිලා **2015** දෙසැම්බර් මස 31 දිනට අදාළ ප්‍රගතිය මෙම කාර්ය සාධන වාර්තාව මඟින් ඉදිරිපත් කෙරේ.



ආයුර්වේද දෙපාර්තමේන්තුව

## 1.2 දැක්ම

"ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රම තුළින් සැමට සුවසෙත"

## 1.3 මෙහෙවර

"ආයුර්වේද හා පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය, සංවර්ධනය හා අනන්‍යතාව සුරක්ෂිත කිරීම තුළින් සැමට සුවසෙත ළඟා කර දීම සඳහා ජාතික මට්ටමින් වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම"

## 1.4 ප්‍රධාන කාර්යයන්

- පර්යේෂණ හා ශික්ෂණ කටයුතු සඳහා රෝහල් හා අනෙකුත් අංශ පිහිටුවීම හා නඩත්තු කිරීම
- සම්මන්ත්‍රණ, අභ්‍යාස පන්ති, හා අධ්‍යයන පාඨමාලා පැවැත්වීම
- සායනික වෛද්‍ය සේවා හා සාහිත්‍ය පර්යේෂණ පැවැත්වීම
- ඖෂධීය ශාක වගා කිරීම, සංරක්ෂණය හා ප්‍රචලිත කිරීම
- දිවයිනේ සියලු ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් අධීක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම
- ආයුර්වේද රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදන ආයතන හා පෞද්ගලික ආයුර්වේද අධ්‍යාපනයට අදාළ කටයුතු සඳහා නීති හා රෙගුලාසි සකස් කිරීම

## 1.5 ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබන ආයතන

- රෝහල් සේවා (බොරැල්ල, ගම්පහ, කයිතඩි, මන්චන්තොඩුවායි, අම්පාර, ත්‍රිකුණාමලය)
- පර්යේෂණ කටයුතු (නාවින්න බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය, චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ, හම්බන්තොට)
- අධ්‍යාපන හා පුහුණු කිරීම් (දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය, නාවින්න)
- ඔසු උයන් (හල්දුම්මුල්ල, පට්ටිපොළ, ගිරාඳුරුකෝට්ටේ, පල්ලෙකැලේ, නාවින්න, පින්නදූව, කන්නෙලිය)

## 1.6 සාමාන්‍ය පරිපාලනය

1. ප්‍රධාන කාර්යාලය
    a. ආයතන සහ පාලන අංශය
    b. සංවර්ධන අංශය
    c. ශිල්පීය අංශය
    d. මූල්‍ය අංශය
    e. විභාග අංශය
2. ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල
3. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල (ශික්ෂණ) -යක්කල
4. සිද්ධ ශික්ෂණ රෝහල - කයිතඩි
5. ආයුර්වේද රෝහල - මන්වන්තොඩුවායි
6. ආයුර්වේද රෝහල - අම්පාර
7. සිද්ධ ශික්ෂණ රෝහල - ත්‍රිකුණාමලය
8. බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය - නාවින්න
9. චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල - හම්බන්තොට
10. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය
11. ආයුර්වේද දෙපාර්තමේන්තු ඔසු උයන් (හල්දුම්මුල්ල, පට්ටිපොළ, ගිරාඳුරුකෝට්ටේ, පල්ලෙකැලේ, නාවින්න, පින්නදූව, කන්නෙලිය)

## 1.7 ආයතනික ව්‍යුහය



## 1.8 මූල්‍ය ප්‍රගතිය - 2015

| කාණ්ඩය/ වැය විෂය/අයිතමය | 2015 වර්ෂයේ ප්‍රතිපාදන (රු.) | 2015 වර්ෂයේ වියදම (රු.) | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **1,166,967,000** | **1,109,013,253** | **95** |
| 1. සාමාන්‍ය පරිපාලනය | 106,835,000 | 97,796,505 | 92 |
| 2. රෝහල් සේවා | 788,022,000 | 753,799,553 | 96 |
| 3. පර්යේෂණ | 165,690,000 | 157,721,611 | 95 |
| 4. අධ්‍යාපන හා පුහුණු | 37,145,000 | 33,674,864 | 91 |
| 5. ඖෂධ වගාව, සංරක්ෂණය හා ව්‍යාප්තිය | 69,275,000 | 66,020,720 | 95 |
| **ප්‍රාග්ධන වියදම්** | **575,000,000** | **413,011,407** | **72** |
| 1. සාමාන්‍ය පරිපාලනය | 15,400,000 | 10,583,899 | 69 |
| 2. රෝග නිවාරණ සේවා | 335,022,000 | 312,740,010 | 93 |
| 3. පර්යේෂණ | 192,778,000 | 69,508,318 | 36 |
| 4. අධ්‍යාපන හා පුහුණු | 6,100,000 | 1,852,303 | 30 |
| 5. ඖෂධ වගාව, සංරක්ෂණය හා ව්‍යාප්තිය | 25,700,000 | 18,326,877 | 71 |
| **මුළු වියදම්** | **1,741,967,000** | **1,522,024,662** | **87** |
| 1. සාමාන්‍ය පරිපාලනය | 122,235,000 | 108,380,405 | 89 |
| 2. රෝග නිවාරණ සේවා | 1,123,044,000 | 1,066,539,564 | 95 |
| 3. පර්යේෂණ | 358,468,000 | 227,229,929 | 63 |
| 4. අධ්‍යාපන හා පුහුණු | 43,245,000 | 35,527,167 | 82 |
| 5. ඖෂධ වගාව, සංරක්ෂණය හා ව්‍යාප්තිය | 94,975,000 | 84,347,597 | 89 |

## 2. ආයතන සහ පාලන අංශය

**ආයතන සහ පාලන අංශයේ කාර්ය භාරය**

1. සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා දේශීය වෛද්‍ය අංශය යටතේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පාලන කටයුතු සිදු කිරීම.
2. සියලු පළාත් සභාවල දේශීය හා ආයුර්වේද අංශයන්ට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම
3. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අනුයුක්ත ආයුර්වේද වෛද්‍යවරුන්ගේ පරිපාලන කටයුතු හා ආයතනික කටයුතු පවත්වාගෙන යාම.
4. ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මධ්‍යම රජය යටතේ ඇති සියලුම ආයතනවල කාර්ය මණ්ඩල සම්බන්ධව ආයතනික සහ පාලන කටයුතු පවත්වාගෙන යාම.
5. ඒ ඒ අංශයන්හි ආයතනික ප්‍රගතිය සමාලෝචනය කිරීම.
6. කාර්ය මණ්ඩලයේ සියලුම පරිපාලන කටයුතු සිදු කිරීම.
7. දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ ප්‍රතිපත්ති සකස් කිරීම සහ සේවා ව්‍යවස්ථා සැකසීම.
8. දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ සම්බන්ධ කටයුතු පවත්වාගෙන යාම.
9. වෙබ් අඩවිය (**www.ayurveda.gov.lk**) පවත්වාගෙන යාම.
10. ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නීති සහ විනය කටයුතු පවත්වාගෙන යාම.

**ආයතන සහ පාලන අංශයේ ප්‍රගතිය**

1. 2015 වර්ෂයේ PL – 02 ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය තනතුරු සඳහා නිලධාරීන් 90 දෙනෙකුට උසස්වීම් ලබා දෙන ලදී.
2. ආයුර්වේද වෛද්‍යවරු I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණ 2015.11.30 දින පවත්වා ඇත.
3. සම්බාහන තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇති අතර ඊට අවශ්‍ය ලිඛිත විභාගය සඳහා කටයුතු සූදානම් වෙමින් පවතී.
4. තාක්ෂණික නිලධාරීන් බඳවා ගැනීම සඳහා ගැසට් නිවේදනය සැකසීමට අදාළව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා වාර කිහිපයක් පවත්වා නිවේදනයේ අවසාන කොටස් සකස් කරමින් පවතී.

**පුහුණු වැඩසටහන් - 2015 වර්ෂය**

| අනු අංකය | ආයතනය | විස්තරය | කාල සීමාව |
|---|---|---|---|
| 1. | හල්දුම්මුල්ල ඖෂධ උද්‍යානය | ඖෂධ නිෂ්පාදනාගාරයේ ඵලදායිතාව සංවර්ධනය<br>රෝහල් කාර්ය මණ්ඩලය - 45 දෙනෙකු | දින 03 |
| 2. | නිපුණතා සංවර්ධන අරමුදල | රාජ්‍ය ආයතනවල විගණන ප්‍රශ්න අවම කිරීම<br>විගණන සහකාර 01 | දින 02 |
| 3. | කාර්මික තාක්ෂණ ආයතනය | Certificate Course on Herbal Drugs and Cosmetics Value Addition Techniques - වෛද්‍යවරු 03 | මාස 1 $^1/_2$ |
| 4. | නිපුණතා සංවර්ධන අරමුදල | බඳවා ගැනීමේ පටිපාටි - රා.ක.ස. 04 | දින 02 |
| 5. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | වායු විමෝචන ප්‍රමිතීන් පවත්වාගෙන යාම පිළිබඳව රාජ්‍ය ආයතනවල රියදුරන් දැනුවත් කිරීම - රියදුරන් 06 | දින 01 |
| 6. | නිපුණතා සංවර්ධන අරමුදල | රියදුරු පුහුණුව - රියදුරු 03 | දින 02 |
| 7. | PRAG Institute | විස්තරාත්මක ප්‍රසම්පාදන පටිපාටිය - ගණකාධිකාරී 01 | දින 01 |
| 8. | නිපුණතා සංවර්ධන අරමුදල | How to be a Brilient Manager - වෛද්‍යවරු 02 | දින 01 |
| 9. | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | වෛද්‍ය ලේඛන පිළිබඳ රජයේ නිලධාරීන් දැනුවත් කිරීම - වෛද්‍යවරු 12 | දින 01 |
| 10. | ජාතික විද්‍යා පදනම | සම්ප්‍රදායික ජන සංගීත නාද මාලා හා තාල රටාවන්ගේ විද්‍යාත්මක පසුබිම හා එහි චිකිත්සීය ගුණය පිළිබඳ වැඩමුළුව - වෛද්‍යවරු 04 | දින 01 |
| 11. | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | රාජ්‍ය ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ එක්දින වැඩමුළුව - සහකාර කොමසාරිස් (සංවර්ධන) | දින 01 |
| 12. | නිපුණතා සංවර්ධන අරමුදල | රජයේ කාර්යාලයක ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම් - රා.ක.ස. 07 | දින 02 |
| 13. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | වායු විමෝචන ප්‍රමිතීන් පවත්වාගෙන යාම පිළිබඳ රාජ්‍ය ආයතනවලට සම්බන්ධ ප්‍රවාහන නිලධාරීන් දැනුවත් කිරීම - කාර්මික නිලධාරී මෝටර් රථ | දින 01 |
| 14. | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | Non Communicable Disease for Special Grade Nursing Officers - හෙද පාලිකා 01 | දින 01 |
| 15. | Seronity, Kalutuwawa | ආකල්ප සංවර්ධන වැඩමුළුව - දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය | දින 01 |
| 16. | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | දෙමළ භාෂා පාඨමාලාව - දෙපාර්තමේන්තු නිලධාරීන් | මාස 06 |
| 17. | ජාතික භාෂා හා පුහුණු ආයතනය | දෙමළ භාෂා වැඩමුළුව - රා.ක.ස. 03 | දින 12 |

## 3. සංවර්ධන අංශය

### සංවර්ධන අංශයේ කාර්ය භාරය

1. දෙපාර්තමේන්තුව හා ඒ යටතේ ඇති ආයතනවල ඉදි කිරීම් හා නඩත්තු කටයුතු සිදු කිරීම.
2. දෙපාර්තමේන්තුව සතු ඔසු උයන් පාලනය සහ නඩත්තු කිරීම.
3. පාසැල් ඔසු උයන් ව්‍යාප්ත කිරීම.
4. දේශීය ඖෂධීය පාන වර්ග ජනප්‍රිය කිරීම.
5. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය පුළුල් කිරීම සහ එම වෛද්‍ය ක්‍රම ප්‍රචලිත කිරීම උදෙසා ප්‍රදර්ශන පැවැත්වීම.
6. පාසැල්, ආගමික සිද්ධස්ථාන, රාජ්‍ය ආයතන සඳහා නොමිලේ ඔසු පැළ ලබා දීම.
7. ජාතික උත්සව සංවිධානය කිරීම (හිසතෙල් ගෑමේ රාජ්‍ය උත්සවය).
8. ඖෂධ පැළෑටි සංරක්ෂණය සහ ව්‍යාප්ත කිරීමේ කටයුතු සංවිධානය කිරීම.
9. ආයුර්වේද සංරක්ෂණ සහා සම්බන්ධ කටයුතු ඉටු කිරීම.
10. ජංගම සායන පැවැත්වීම සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

### 2015 වසරේ ප්‍රගතිය - සංවර්ධන අංශය

- **හිසතෙල් ගෑමේ රාජ්‍ය උත්සවය - 2015.04.15**



2015 හිසතෙල් ගෑමේ උත්සවය

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය, ගරු රාජිත සේනාරත්න මැතිතුමාගේ අනුශාසකත්වයෙන් පොළොන්නරුවේ, කඳුරුවෙල ජයන්ති විහාරයේ දී උත්සවශ්‍රීයෙන් පවත්වන ලදී.

- **ජංගම සායන**

පාරම්පරික වෛද්‍ය ක්‍රමයන් රැක ගනිමින්, දේශීය වෛද්‍ය ක්‍රමයන්ට ජනතාව හුරු කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුව ආයුර්වේද ජංගම සායන පවත්වනු ලබයි.



ජංගම සායනකදී රෝගියකු පරීක්ෂා කිරීම

රාජ්‍ය ආයතන, විහාරස්ථාන, පෞද්ගලික ආයතන සහ පාසල් වල ඉල්ලීම් අනුව සායන පැවැත්වීම සඳහා අදාළ රෝහල් වෙත ආයුර්වේද කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව පවරනු ලබයි.

දෙපාර්තමේන්තුව වෙත ලැබුණු සායන ඉල්ලීම්, අදාළ ප්‍රදේශය අනුව පහත සඳහන් ආකාරයට ආයුර්වේද රෝහල් වෙත පවරන ලදී.

| අනු අංකය | දිනය | ඉල්ලීම කළ ආයතනය සහ සායනය පැවැත්වූ ස්ථානය | සායනය පැවැත්වූ ආයතනය |
|---|---|---|---|
| 1. | 2015.01.24 | අම්පාර පොලිසිය - කරංගාව විද්‍යාලය | ආයුර්වේද රෝහල - අම්පාර |
| 2. | 2015.02.15 | ගරු පණ්ඩු බණ්ඩාරනායක මැතිතුමා.<br>මාලිගාතැන්න එක්සත් විජය පරාක්‍රම සමිතිය | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල - යක්කල |
| 3. | 2015.02.22 | ගම්පහ සිරි සුනන්ද දහම් පාසැල් සංවර්ධන සමිතිය | |
| 4. | 2015.02.24 | බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| 5. | 2015.02.26 | උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.<br>අම්/වැරැන්කැටගොඩ මහ විදුහල | ආයුර්වේද රෝහල - අම්පාර |
| 6. | 2015.03.07 | අම්පාර සද්ධාතිස්ස විදුහල | |
| 7. | 2015.03.14 | බොරැල්ල ආයුර්වේද රෝහල.<br>කුඩාවස්කඩුව, වස්කඩුව, සරණ වැඩිහිටි සමිතිය | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල |
| 8. | 2015.03.28 | සීදූව පොලිස් ස්ථානය.<br>අලවතුපිටිය කණිෂ්ඨ විද්‍යාලය | බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| 9. | 2015.03.28 | පොලිස් මධ්‍යම කඳවුර - අම්පාර.<br>අම්පාර උදයපුර විදුහල | ආයුර්වේද රෝහල - අම්පාර |
| 10. | 2015.05.07 | දෙමටගොඩ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ශාසනාරක්ෂණ බල මණ්ඩලය | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල |
| 11. | 2015.05.09 | සැනසුම සහන පදනම | |
| 12. | 2015.05.23 | හම්බන්තොට පොලිසිය<br>සිරියානාථ ග්‍රාම නිලධාරී වසම | චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල -හම්බන්තොට |
| 13. | 2015.05.29 | මංජු ශ්‍රී අරංගල මැතිතුමා (විපක්ෂ නායක, බස්නාහිර පළාත් සභාව)<br>කෝට්ටේ, සෙත්සිරිපාය ජාතික පොදු සේවා සංගමය | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල |
| 14. | 2015.06.11 | කපුගොඩ, ලීනියා ඇක්වා ප්‍රයිවට් ලිමිටඩ් | |
| 15. | 2015.06.15 | නුගේගොඩ, ඇඹුල්දෙනිය සී/ස උඩහමුල්ල නැගෙනහිර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමිතිය - ඇඹුල්දෙනිය සණස සමිතිය | |
| 16. | 2015.06.19 | කැළණිය ශ්‍රී සුමනාරාම පුරාණ මහා විහාරය | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල - යක්කල |
| 17. | 2015.06.21 | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.<br>අගලවත්ත ප්‍රදේශය | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල |
| 18. | | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.<br>පැලවත්ත, පිටිගල පාර, බොම්බිල් පරිශ්‍රය | |

| | | | |
|---|---|---|---|
| 19. | 2015.06.24 | කොස්සින්න ශ්‍රී පඤ්ඤානන්ද වැඩිහිටි සමිතිය | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල - යක්කල |
| 20. | 2015.06.27 | බක්කිඇල්ල පොලිස් ස්ථානය.<br>නුගේලන්ද ජයසුමනාරාම විහාරය | ආයුර්වේද රෝහල - අම්පාර |
| 21. | 2015.06.21, 07.04, 07.11, 07.18, 07.25 | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය පෞද්ගලික ලේකම්.<br>පැලවත්ත, අගලවත්ත, මතුගම, දොඩංගොඩ, පානදුර | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල<br>නාවින්න - වකුගඩු සායනය |
| 22. | 2015.07.04 | අම්පාර පොලිසිය,<br>කොටවෙහෙර විද්‍යාලය | ආයුර්වේද රෝහල - අම්පාර |
| 23. | | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.<br>බුලත්සිංහල හෝමියෝපති සායනය | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල |
| 24. | 2015.07.11 | පොලිස් ස්ථානය - හම්බන්තොට,<br>වැලිගත්ත ග්‍රාම නිලධාරී වසම | චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල -හම්බන්තොට |
| 25. | 2015.07.30-31 | රාජගිරිය දේශීය වෛද්‍ය විද්‍යාතන ආයුර්වේද ව්‍යාප්ත අනු කමිටුව,<br>කතරගම පූජා භූමිය | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල<br>චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල -හම්බන්තොට |
| 26. | 2015.08.04 | ලීනියා ඇක්වා පුද්ගලික සමාගම | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල |
| 27. | 2015.08.09 | කඩවත, එඩියුකෙයාර් පෙර පාසල | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල - යක්කල |
| 28. | 2015.08.27 | කැලණිය, ගෝනවල, ශ්‍රී ආනන්දාරාමය | බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| 29. | 2015.09.15, 28, 2015.10.13, 20, 28 | හම්බන්තොට සර්වෝදය ප්‍රාදේශීය මධ්‍යස්ථානය. | චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල -හම්බන්තොට |
| 30. | 2015.10.06 | සිරිමාවෝ බණ්ඩාරනායක විදුහල.<br>නිකවැරටියේ කුමර විද්‍යාලය | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල |
| 31. | 2015.10.17 | බක්කිඇල්ල පොලිස් ස්ථානය.<br>නුගේලන්ද ජයසුමනාරාම විහාරය,<br>රජගලතැන්න බෝධිරාජාරාම විහාරය | ආයුර්වේද රෝහල - අම්පාර |
| 32. | 2015.10.22 | නාමල්තලාව ජොෂ්ය පුරවැසි සංගමය.<br>අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | |
| 33. | 2015.10.26 | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.<br>අනුරාධපුර මාංකඩවල ශ්‍රී සාරද පිරිවෙන් විහාරස්ථානය | උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| 34. | 2015.10.28 | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.<br>පොළොන්නරුව, ජයන්තිපුර, තඹලවැව විද්‍යාලය | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල |
| 35. | 2015.10.30 | යක්කල අනුර ආදර්ශ කණිෂ්ඨ විදුහල | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල - යක්කල |

| | | | |
|---|---|---|---|
| 36. | 2015.11.07 | අම්පාර පොලිසිය.<br>අම්පාර, හැගොඩ ඉන්ද්‍රසාර විද්‍යාලය | ආයුර්වේද රෝහල - අම්පාර |
| 37. | 2015.11.14 | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.<br>රාගම, මත්තුමගල, කරුණාරත්න බෞද්ධ විදුහල | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල |
| 38. | 2015.11.21 | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.<br>නුගේගොඩ, මිරිහාන, ස්ටැන්ලි තිලකරත්න විද්‍යාල භූමිය | |
| 39. | 2015.11.21 | හම්බන්තොට පොලිසිය.<br>යහන්ගල, බටහිර ග්‍රාම සේවා වසම, ප්‍රාථමික විදුහල | වමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල -හම්බන්තොට |
| 40. | 2015.11.22 | කිරිදිවැල පොලිසිය.<br>බප/ගම් මේරිලැන්ඩ් විදුහල | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල - යක්කල |
| 41. | 2015.11.25 | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.<br>අවිස්සාවේල්ල, පුවක්පිටිය, තුම්මෝදර ඉළුක්කෝවිට විද්‍යාලය | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල |
| 42. | 2015.11.29 | වැලිවේරිය පොලිසිය.<br>නැදුන්ගමුව සිරිසීවලී විදුහල | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල - යක්කල |
| 43. | 2015.12.05 | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.<br>අම්බලන්ගොඩ සවුත්ගේට් ජාත්‍යන්තර පාසල | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල |
| 44. | 2015.12.06 | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.<br>ශාන්ත මරියා දේවස්ථානය | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල - යක්කල |
| 45. | | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය<br>ශ්‍රී විජයඝෝෂ විද්‍යාලය, පානදුර | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල |
| 46. | 2015.12.26-30 | දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. | දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| 47. | අඛණ්ඩව | මාවතගම පිලැස්ස ශ්‍රී බෝධි මළුව විහාරය | වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව |

- **දේශීය පාන වර්ග ජනප්‍රිය කිරීමේ වැඩසටහන**

ජනතාව දේශීය පාන වර්ග සඳහා යොමු කිරීමේ අරමුණින් ආයුර්වේද කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව රාජ්‍ය උත්සව සහ වෙනත් සංවිධානවල උත්සව සඳහා කොළකැඳ සහ ඔසුපැන් නොමිලේ ලබා දීම සිදු කෙරේ. 2015 වසරේදී වැඩසටහන් 17ක් සඳහා කොළකැඳ හා ඔසුපැන් 50,000 ක් පමණ නොමිලේ ලබා දී ඇත.



දේශීය පානය - කොළකැඳ



දේශීය පානය - ඔසුපැන්

- **නොමිලේ ඖසු පැළ ලබා දීම**

ආයුර්වේද කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව, පාසල්, රාජ්‍ය ආයතන වලින් ලැබෙන්නා වූ ඉල්ලීම් සඳහා ඖසු පැළ 25 බැගින් නොමිලේ ලබා දීම සිදු කෙරේ. මේ වසර තුළදී පැළ 9,121 ක ප්‍රමාණයක් ලබා දීමට අනුමැතිය දී ඇත.

- **ආයුර්වේද ප්‍රදර්ශන**

ආයුර්වේදය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ අරමුණින්, දේශීය ඖෂධ පැළ සහ දේශීය ප්‍රතිකාර සේවා පිළිබිඹු වන ආකාරයෙන් ප්‍රදර්ශන සඳහා ඉදිරිපත් කිරීම මෙමඟින් සිදු කෙරිණි.

| අනු අංකය | දිනය | ස්ථානය |
|---|---|---|
| 1. | 2015.05.09-10 | ගනේමුල්ල, කොස්සින්න ශ්‍රී සීලානන්ද ධර්ම විද්‍යාලය |
| 2. | 2015.06.24-28 | ආචාර්ය කුලසිංහ මහා විදුහලේ ස්වර්ණ ජයන්ති උත්සවය වෙනුවෙන් පැවැත් වූ "සිංහාභින්දන අධ්‍යාපනික ප්‍රදර්ශනය" |
| 3. | 2015.06.03-05 | ආයුර්වේද එක්ස්පෝ 2015 – බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව   ආයුර්වේද එක්ස්පෝ 2015 |
| 4. | 2015.09.29 | අධ්‍යාපනික ප්‍රදර්ශනය -කොටුගොඩ, රද්දොළුව, ශ්‍රී පඤ්ඤානන්ද ජාතික පාසල |
| 5. | 2015.09.22,23 | අධ්‍යාපනික ප්‍රදර්ශනය - අවිස්සාවේල්ල, සීතාවකපුර, බප/හෝ/ශ්‍රී සුධර්මාරාම විද්‍යායතන පිරිවෙන |
| 6. | 2015.12.26-31 | ගාලු සමය ප්‍රදර්ශනය සහ සැණකෙළිය - ගාල්ල සමනළ ක්‍රීඩාංගනය |

- **ඉදි කිරීම්, අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු**

2015 වසරේ ඉදි කිරීම්, අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු පහත සඳහන් ආකාරයට සිදු කර ඇත.

| අනු අංකය | ඉදි කිරීම් කටයුතු | මූල්‍ය ප්‍රතිපාදන (රු.මි.) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|
| **1** | **ප්‍රධාන කාර්යාලය** | **3.0** | | **0.717** |
| 1.1 | ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ යතුරු පැදි, පාපැදි සහ ත්‍රිරෝද රථ නැවත්වීම සඳහා අංගනයක් ඉදි කිරීම. | | ඉදි කිරීම් අවසන් කර ඇත. 100% | |
| 1.2 | පැළ අලෙවිසැලක් ඉදි කිරීම. | | ප්‍රසම්පාදන කටයුතු වලින් අනතුරුව තෝරා ගත් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් වී නැත. | |
| 1.3 | රියදුරු විවේකාගාරයේ ඉහළ මාලයේ බැල්කනිය සඳහා ආවරණය සැකසීම. | | ඉදි කිරීම් අවසන් කර ඇත. 100% | |
| **2** | **ශික්ෂණ රෝහල්** | | | |
| 2.1 | වාට්ටු සංකීර්ණය ඉදි කිරීම - **බොරැල්ල ආයුර්වේද රෝහල** | **247.122** | 2015 මැයි 27 දින මාගා ආයතනය වෙත ඉදි කිරීම් සම්බන්ධයෙන් ටෙන්ඩරය පිරිනමා ඉදි කිරීම් ආරම්භ කරන ලදී. | **247.122** |
| 2.2 | වාට්ටු සංකීර්ණය ඉදිකිරීම - **මන්වන්තොඩුවායි ආයුර්වේද රෝහල** | **-** | බොරැල්ල ආයුර්වේද රෝහලේ ඉදි කිරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් මේ සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන මාරු කරන ලදී. | **-** |
| 2.3 | දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම - **කයිතඩි ආයුර්වේද රෝහල** | **7.0** | ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් පස් සාම්පල පරික්ෂාව සිදු කරන ලදී. ICTAD මඟින් ටෙන්ඩර් පත්‍රිකා සකස් කරමින් පවතී. | **0.511** |
| 2.4 | දස මහල් රෝහල් සංකීර්ණයක් ඉදිකිරීම - **යක්කල ආයුර්වේද රෝහල** | **5.0** | යක්කල විද්‍යායතනය විසින් රෝහලේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා ඉඩම ලබා දීමට එකග වී ඇත. එබැවින් ප්‍රසම්පාදන කටයුතු අරඹන මෙන් අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත. | **-** |

| | | | | |
|---|---|---|---|---|
| 2.5 | වාට්ටු සංකීර්ණය ඉදිකිරීම - **ත්‍රිකුණාමලය ආයුර්වේද රෝහල** | - | බොරැල්ල ආයුර්වේද රෝහලේ ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් මෙම ප්‍රතිපාදන ඒ සඳහා මාරු කරන ලදී. | - |
| 2.6 | වකුගඩු රෝගී ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදිකිරීම - **මැදවච්චිය** | **37.0** | ඉදි කිරීම් සිදු කරමින් පවතී. 70% | **32.0** |
| **3** | **පර්යේෂණ රෝහල්** | | | |
| 3.1 | 1. පාරම්පරික වෛද්‍ය ක්‍රම පිළිබඳ පර්යේෂණ රෝහල ඉදි කිරීම - මිහින්තලය | **25.0** | ඉදි කිරීම් සිදු කරමින් පවතී. 80% | **1.9** |
| **4** | **දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය** | **1.0** | | **-** |
| 4.1 | ශ්‍රවණාගාරය, ආපනශාලාව සමඟ වැසිකිළි පද්ධතිය ඉදි කිරීම - 3 වන අදියර | | ඇස්තමේන්තු සකස් කර නිම වී නොමැත. | |
| 4.2 | පළමු මහලේ විවෘත කළ හැකි දොර සඳහා ග්‍රිල් වැටක් ඉදි කිරීම | | | |
| 4.3 | නේවාසිකාගාරයේ අත්වැල නැවත ඉදි කිරීම | | | |
| **5** | **පර්යේෂණ ඔසු උයන්** | | | |
| 5.1 | මුළුතැන්ගෙය සමඟ උඩුමහල ඉදිකිරීම - පට්ටිපොළ ඔසු උයන | **5.0** | ඉදි කිරීම් අවසන් කර ඇත. 100% | **4.9** |

| අනු අංකය | අලුත්වැඩියා කටයුතු | මූල්‍ය ප්‍රතිපාදන (රු.මි.) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|
| **1** | **ප්‍රධාන කාර්යාලය** | **1.2** | | **1.2** |
| 1.1 | රියදුරු විවේකාගාරය අලුත්වැඩියාව | | අලුත්වැඩියාවන් අවසන් කර ඇත. 100 % | |
| 1.2 | වැසිකිළි අලුත්වැඩියාව | | වැසිකිළි අලුත්වැඩියාවන් සිදුකරමින් පවතී. | |
| **2** | **ශික්ෂණ රෝහල්** | **25.0** | | **17.012** |
| 2.1 | පංචකර්ම ගොඩනැගිල්ලේ සෝදා පිරිසිදු කරන ජලය බැහැර කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම | | අලුත්වැඩියාවන් අවසන් කර ඇත. 100 % | |
| 2.2 | පංචකර්ම ගොඩනැගිල්ලේ 3 වන මහල අලුත්වැඩියාව | | ඇස්තමේන්තු සකස් කර ප්‍රසම්පාදන කටයුතු සඳහා භාර දී ඇත. | |

| | | | | |
|---|---|---|---|---|
| 2.3 | ඖෂධාගාරය සහ ගබඩාව අලුත්වැඩියාව | | අලුත්වැඩියාවන් අවසන් කර ඇත. 100 % | |
| 2.4 | බාහිර රෝගී අංශයේ වැසිකිළි අලුත්වැඩියාව | | | |
| 2.5 | නළ පද්ධතිය අලුත්වැඩියාව | | | |
| 2.6 | ප්‍රධාන මළ අපවහන පද්ධතිය අලුත්වැඩියාව | | ඇස්තමේන්තු සකස් කර ප්‍රසම්පාදන කටයුතු සඳහා භාර දී ඇත. | |
| 2.7 | බාහිර රෝගී අංශයේ වහලය අලුත්වැඩියාව - **මන්වන්තුඩුව ආයුර්වේද රෝහල** | | අලුත්වැඩියාවන් අවසන් කර ඇත. 100 % | |
| 2.8 | යන්ත්‍රාගාර ගොඩනැගිල්ලේ වහල අලුත්වැඩියාව **- අම්පාර ආයුර්වේද රෝහල** | | අලුත්වැඩියාවන් අවසන් කර ඇත. 100 % | |
| **3** | **පර්යේෂණ රෝහල්** | **3.0** | | **3.0** |
| 3.1 | පැරණි ඖෂධාගාරය අලුත්වැඩියාව - නාවින්න පර්යේෂණ රෝහල | | අලුත්වැඩියාවන් අවසන් කර ඇත. 100 % | |
| **4** | **දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය** | **0.6** | | **-** |
| 4.1 | ශ්‍රවණාගාරය සහ නේවාසිකාගාරයේ වැසිකිළි අලුත්වැඩියාව | | ඇස්තමේන්තු සකස් කරමින් පවතී. | |
| **5** | **පර්යේෂණ ඔසු උයන්** | **10.0** | | **9.882** |
| 5.1 | ගොඩනැගිලි අලුත්වැඩියාව - කන්නෙලිය ඔසු උයන | | අලුත්වැඩියාවන් සිදු කරමින් පවතී. 90 % | |
| 5.2 | දැල් ගෘහය, දේශනාගාරය අලුත්වැඩියාව - පින්නදූව ඔසු උයන | | අලුත්වැඩියාවන් අවසන් කර ඇත. 100 % | |
| 5.3 | ගබඩාව අලුත්වැඩියාව සහ වැඩිදියුණු කිරීම - පට්ටිපොළ ඔසු උයන | | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති බැවින් 2016 වසරේ සිදු කිරීමට නියමිතය. | |
| 5.4 | නේවාසිකාගාරය සහ වැසිකිළි අලුත්වැඩියාව - පට්ටිපොළ ඔසු උයන | | | |

## 4. ශිල්පීය අංශය

**ශිල්පීය අංශයේ කාර්ය භාරය**

1. සමාගම්/ ආයතන සඳහා නියමිත ගාස්තු අය කිරීම හා ලියාපදිංචිය.
   i. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර සඳහා බලපත්‍ර ලබා දීම.
      a. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය ඇසුරුම්, තීරු බද්දෙන් නිදහස් ආනයනය කිරීමට අනුමැතිය ලබා දීම.
      b. නිෂ්පාදනාගාර වලට අවශ්‍ය පරිපාක ස්ප්‍රීතු, කංසා චූර්ණ, අබිං හා අන්තරායක ඖෂධ පාලනයක් සහිතව නිර්දේශ කිරීම.
   ii. ලියාපදිංචි ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර වලට අවශ්‍ය අමු හා නිමි ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබා දීම.
   iii. ආයුර්වේද ඖෂධ ගබඩා සඳහා බලපත්‍ර ලබා දීම.
   iv. දේශීය හා ආනයනික ආයුර්වේද නිමි ඖෂධ සඳහා බලපත්‍ර ලබා දීම.
      a. යෝග සංග්‍රහ කමිටුව
      b. ඖෂධ අනු කමිටු
      c. ඖෂධ ප්‍රචාරක කමිටුව
   v. ආනයනික නිමි ආයුර්වේද ඖෂධ සමාගම් සඳහා බලපත්‍ර ලබා දීම.
   vi. තීරු බද්දෙන් නිදහස්ව ආනයනය කළ ආයුර්වේද වියළි ඖෂධ ගෙන්වන ආනයනික සමාගම් සඳහා බලපත්‍ර ලබා දීම.
      a. තීරු බද්දෙන් නිදහස්ව ආනයනය කළ හැකි ආයුර්වේද වියළි ඖෂධ සඳහා නිර්දේශ ලබා දීම.
   vii. පෞද්ගලික ආයුර්වේද සේවා ආයතන සඳහා බලපත්‍ර ලබා දීම.
      a. පෞද්ගලික ආයුර්වේද රෝහල්
      b. ආයුර්වේද පංචකර්ම ප්‍රතිකාර මධ්‍යස්ථාන
      c. පෞද්ගලික ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන
      d. සංචාරක හෝටල් ආශ්‍රිත පංචකර්ම ප්‍රතිකාර මධ්‍යස්ථාන
   viii. ආයුර්වේද ඖෂධ වෙළඳ සැල් සඳහා බලපත්‍ර ලබා දීම.
   ix. ආයුර්වේද ඖෂධ උද්‍යාන සඳහා බලපත්‍ර ලබා දීම.
2. හිස තෙල් ගෑමේ රාජ්‍ය උත්සවය වෙනුවෙන් නිකුත් කළ යුතු ප්‍රකාශන සැකසීම හා මුද්‍රණය කිරීම.
   i. ආයුර්වේද අලුත් අවුරුදු ලිත
   ii. ආයුර්වේද අලුත් අවුරුදු අත් පොත
3. නීති සංග්‍රහ කමිටුව
   i. ආයුර්වේද අණපනත් සැකසීම.
   ii. ආයුර්වේද නිර්ණායක සැකසීම.
   iii. අයදුම්පත්‍ර සැකසීම.

4. පර්යේෂණ කාරක සභාව
   i. ආයුර්වේද සමීක්ෂාව සංස්කරණය හා මුද්‍රණයට යොමු කිරීම.
   ii. ආයුර්වේද ග්‍රන්ථ මුද්‍රණයට යොමු කිරීම.
5. ආයුර්වේද සේවා ආයතන වාර්ෂිකව විමර්ශනය කිරීම සඳහා පරීක්ෂණ කණ්ඩායම් පත් කිරීම හා වාර්තා සැකසීම.
6. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව (අධිකරණ කටයුතු), ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, ආනයන අපනයන පාලක දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පාරිභෝගික කටයුතු අධිකාරිය වැනි රජයේ ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
7. භාවිතා කරන ආකෘති පත්‍ර භාෂාත්‍රයෙන් දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කිරීම හා යාවත්කාලීන කිරීම.

**2015 වසරේ ප්‍රගතිය - ශිල්පීය අංශය**

- යෝග සංග්‍රහ කමිටුව හා අනු කමිටු රැස් කර, දේශීය හා ආනයනික ඖෂධයන්ට අනුමැතිය ලබා දීම, ලියාපදිංචිය හා ඒ සඳහා නියමිත ගාස්තු අය කිරීම

i. යෝග සංග්‍රහ කමිටුව රැස් වූ වාර ගණන 3

ii. අනු කමිටුව රැස් වූ වාර ගණන 3

iii. <u>දේශීය නිෂ්පාදිත ඖෂධ සූත්‍ර කමිටුවට ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍ර නිකුත් කිරීම</u>

| | |
|---|---|
| නිකුත් කළ අයදුම්පත් ගණන | 312 |
| අයදුම්පත් නිකුත් කිරීමෙන් ලද ආදායම | රු.31,200.00 |
| නියැදි පරික්ෂාව | 171 |
| නියැදි පරික්ෂාව සිදු කළ අයදුම්පත්වලින් ලද ආදායම | රු.85,500.00 |

iv. <u>දේශීය නිෂ්පාදිත ඖෂධ බලපත්‍ර නිකුත් කිරීම</u>

| | |
|---|---|
| ප්‍රථම වරට ලියාපදිංචිය සඳහා නිකුත් කළ බලපත්‍ර ගණන | 14 |
| බලපත්‍ර 14ක් නිකුත් කිරීමෙන් ලද ආදායම | රු.28,000.00 |
| නිකුත් කළ බලපත්‍රවල ලියාපදිංචිය දීර්ඝ කළ බලපත්‍ර ගණන | 37 |
| බලපත්‍ර 37ක් නිකුත් කිරීමෙන් ලද ආදායම | රු.18,500.00 |

v. <u>ආනයනික ඖෂධ සූත්‍ර කමිටුවට ඉදිරිපත් කිරීමේ අයදුම් පත්‍ර නිකුත් කිරීම</u>

| | |
|---|---|
| නිකුත් කළ අයදුම් පත් ගණන | 350 |
| අයදුම්පත් නිකුත් කිරීමෙන් ලද ආදායම | රු.170,000.00 |
| නියැදි පරික්ෂාව සිදු කළ අයදුම්පත් ගණන | 200 |
| නියැදි පරික්ෂාව සිදු කිරීමෙන් ලද ආදායම | රු.400,000.00 |
| ප්‍රථම වරට ලියාපදිංචිය නිකුත් කළ බලපත්‍ර ගණන | 49 |
| නිකුත් කළ බලපත්‍ර වලින් ලද ආදායම | රු.490,000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීමේ අයදුම්පත් ගණන | 73 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීමෙන් ලද ආදායම | රු.182,500.00 |

- නිමි ඖෂධ ආනයනික සමාගම් ලියාපදිංචිය

i. ආයතන ගණන 01

ii. ආදායම රු.10,000.00

- අනුමැතිය ලබා දුන් ඖෂධ සඳහා මාධ්‍ය ප්‍රචාරණ දැන්වීම් කමිටුව හා අනු කමිටු වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම
    i. මාධ්‍ය ප්‍රචාරණ දැන්වීම් කමිටුව රැස් වූ වාර ගණන 1
    ii. මාධ්‍ය ප්‍රචාරණ දැන්වීම් අනුකමිටුව රැස් වූ වාර ගණන නැත

- තීරුබද්දු රහිතව වියළි ඖෂධ ආනයනය සඳහා අවසර ලබා දීම.
    i. ආනයනය කරන ලද වියළි ඖෂධ ප්‍රමාණය කි.ග්‍රෑ.2,220,408.4

- තීරුබද්දු රහිතව වියළි ඖෂධ ආනයනය කරන ආයතන වාර්ෂික ලියාපදිංචිය ලබා දීමට අදාළ ගාස්තු අය කිරීමේ කටයුතු හා ආකෘති පත්‍ර සකස් කිරීම සිදු කරමින් පවතී.

- පෞද්ගලික සේවා ආයතන ලියාපදිංචිය පිළිබඳ නියෝග මාලා සැකසීම හා ආයුර්වේද සේවා ආයතන ලියාපදිංචිය සඳහා නිර්ණායක සකස් කර අවසන් කර ඇත.

- පෞද්ගලික රෝහල්, පංචකර්ම ආයතන සහ බෙහෙත්ශාලා ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම යටතේ පහත සඳහන් ආදායම් උපයාගෙන ඇත. පරීක්ෂාව සඳහා පරීක්ෂණ කණ්ඩායම් පත් කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කරන ලදී.
    i. පෞද්ගලික රෝහල්
        අයදුම් පත් භාර ගැනීම් රු. 54,000.00
        ප්‍රථම රු. 80,000.00
        වාර්ෂික රු. 37,500.00

    ii. පංචකර්ම ආයතන
        අයදුම් පත් භාර ගැනීම් රු 255,000.00
        ප්‍රථම රු 300,000.00
        වාර්ෂික රු 320,000.00

    iii. හෝටල් ආශ්‍රිත පංචකර්ම
        අයදුම් පත් භාර ගැනීම් රු. 54,000.00
        ප්‍රථම රු. 75,000.00
        වාර්ෂික රු. 90,000.00

    iv. බෙහෙත්ශාලා
        ප්‍රථම රු.271,700.00
        වාර්ෂික රු.13,000.00

- ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර ලියාපදිංචිය ලබාදීම පරීක්ෂාව සඳහා පරීක්ෂණ කණ්ඩායම් පත් කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර ඇත.
  i. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර යටතේ උපයාගත් ආදායම

| | |
|---|---|
| ප්‍රථම ලියාපදිංචිය | රු.140,000.00 |
| වාර්ෂික | රු.408,000.00 |

- ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර සඳහා කංසා, පාරිපාක ස්ප්‍රීතු නිර්දේශ ලබාදීම

| | |
|---|---|
| i. කංසා චූර්ණය | කි .ග්‍රෑ.234.15 |
| ii. කංසා පත්‍ර | ග්‍රෑ. 100 |
| iii. පරිපාක ස්ප්‍රීතු | ලීටර 59,980 .00 |

- ලියාපදිංචි ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර හිමියන්ට, අමු හා නිමි ඖෂධ ප්‍රවාහනය සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම යටතේ ලත් ආදායම

| | |
|---|---|
| i. ප්‍රථම වරට ලියාපදිංචි | රු 9,100.00 |
| ii. වාර්ෂික බලපත්‍ර | රු 28,000.00 |

- දැනට සිංහල මාධ්‍යයෙන් පමණක් ඇති ආකෘති පත්‍ර ඉදිරි පියවරක් ලෙස සිංහල හා ඉංග්‍රීසි යන භාෂා දෙකෙන් අපගේ වෙබ් අඩවියට ඇතුළත් කිරීම.
  i. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර සඳහා ආකෘති පත්‍ර සකස් කර වෙබ් අඩවියට එක්කර ඇත.
- ආයුර්වේද නීති හා අණපනත් සකස් කිරීම හා සංශෝධනය සිදු කරමින් පවතී.
- ආයුර්වේද නීති සංග්‍රහ කමිටුවේ අවසන් යෝජනාව සම්මත කර ගැනීම සාකච්ඡා මට්ටමින් පවතී.
- අබිං ආනයනය කිරීමේ බලතල ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත ලබාගැනීම වෙනුවෙන් මේ වන විට සාකච්ඡා 4ක් පවත්වා ඇත.
- ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර සඳහා වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන ආකාරයට නියාමන පද්ධතියක් සකස් කිරීම
  i. නිර්ණායක සකස්කර අවසන් කර ඇත.
- ආයුර්වේද පර්යේෂණ ආචාර ධර්ම කමිටුවේ කටයුතු පවත්වාගෙන යෑම
  i. 2015 වර්ෂයට නව පර්යේෂණ ආචාර ධර්ම කමිටුව රැස් වී නොමැත.
- ආයුර්වේද පර්යේෂණ අරමුදල පවත්වාගෙන යෑම
  i. 2015 වර්ෂයට පර්යේෂණ ප්‍රගතීන් පෙන්වා නොමැත.

- "ආයුර්වේද සමීක්ෂාව" සැලසුම් කිරීම, මුද්‍රණය කිරීම හා දිවයින පුරා බෙදාහැරීම

  2015 වර්ෂයට පර්යේෂණ කාරක සභාව පත් නොකිරීම මත "සමීක්ෂාව" සඳහා සංස්කරණ මණ්ඩලය පත් කර ගත නොහැකි වූ බැවින් ග්‍රන්ථය මුද්‍රණය කර නොමැත.

- 2015 වර්ෂයේ හිස තෙල් ගෑමේ රාජ්‍ය උත්සවය වෙනුවෙන් ආයුර්වේද ලිත හා අවුරුදු පොත සැලසුම් කිරීම, මුද්‍රණය කිරීම හා දිවයින පුරා බෙදාහැරීම.

| | | | |
|---|---|---|---|
| i. | ලිත් | සිංහල මාධ්‍ය | 60,000 |
| | | දෙමළ මාධ්‍ය | 5,000 |
| ii. | අවුරුදු අත්පොත් | සිංහල මාධ්‍ය | 1,000 |
| | | දෙමළ මාධ්‍ය | 300 |

# 5. මූල්‍ය අංශය

**මූල්‍ය අංශයේ කාර්ය භාරය**

- රෝගී සත්කාර සේවා සතුටුදායකව පවත්වාගෙන යෑම පිණිස අරමුදල් පුරෝකථනය කිරීම සහ කළමනාකරණය කිරීම.
- ආයුර්වේද දෙපාර්තමේන්තුව තුළ ඉහළ ඵලදායිතාවයක් පවත්වා ගනු පිණිස, භෞතික සහ මානව සම්පත් සංවර්ධනය සඳහා මූල්‍ය කළමනාකරණය සිදු කිරීම.
- ප්‍රජා සත්කාර සේවා, විශේෂයෙන් හිසතෙල් ගෑමේ රාජ්‍ය උත්සවය හා අනෙකුත් ආගමික, ජාතික උත්සව සඳහා මූල්‍ය කළමනාකරණය සිදු කිරීම.
- ආයුර්වේද දෙපාර්තමේන්තුවේ එදිනෙදා මහජන සේවාවන් සඵලදායිව හා කාර්යක්ෂමව පවත්වාගෙන යෑම සඳහා පද්ධති හඳුන්වා දීම, කළමනාකරණය හා විමර්ශනය කිරීම.
- කළමනාකරණ ශ්‍රිතයන් හා අදාළ ක්‍රියාකාරකම් යථාවත් පරිදි පවතීද යන්න පිළිබඳ නිරතුරු පරික්ෂා කිරීම හා ඒ පිළිබඳ තොරතුරු හා යෝජනා ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම.
- ඔසු උයන්වල එදිනෙදා කටයුතු යාවත්කාලීනව පවත්වා ගැනීම, ආදායම් වියදම් වාර්තාකරණය හා සංවර්ධනය පිණිස අවශ්‍ය යෝජනා හා උපදෙස් ලබා දීම.
- ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සමස්ත ගිණුම් කටයුතු යාවත්කාලීනව සමාලෝචනය කිරීම.
- ජාතික අයවැය ප්‍රතිපත්තීන් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව පිළිපැදීම පිළිබඳ ක්‍රියාකාරකම් සමායෝජනය කිරීම.
- මාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික සහ වාර්ෂික වාර්තා අනුසාරයෙන් මහා භාණ්ඩාගාරයේ ගිණුම්ගත කිරීමට අවශ්‍ය තොරතුරු සැපයීම.

**2015 ප්‍රගතිය - මූල්‍ය අංශය**

- **2015 වසරේ අත්තිකාරම් 'බී' ගිණුමට අදාළ තොරතුරු- ශීර්ෂය 220011**

2015.01.01 – 2015.12.31 දින දක්වා අත්තිකාරම් 'බී' ගිණුමට සම්බන්ධ මාසික ලැබීම් සහ ගෙවීම්

| අනු අංකය | මාසය | ලැබීම් (රු.) | ගෙවීම් (රු.) |
|---|---|---|---|
| 1. | ජනවාරි | 2,104,363.01 | 1,095,697.00 |
| 2. | පෙබරවාරි | 2,062,489.01 | 1,289,229.00 |
| 3. | මාර්තු | 2,057,248.01 | 3,384,522.00 |
| 4. | අප්‍රේල් | 1,799,587.01 | 11,852,385.00 |
| 5. | මැයි | 2,907,899.01 | 479,144.00 |
| 6. | ජුනි | 3,437,148.01 | 389,544.00 |
| 7. | ජුලි | 3,209,181.51 | 825,389.00 |
| 8. | අගෝස්තු | 3,073,152.51 | 199,439.00 |
| 9. | සැප්තැම්බර් | 3,606,097.28 | 2,005,754.00 |
| 10. | ඔක්තෝම්බර් | 3,140,814.86 | 2,866,700.00 |
| 11. | නොවැම්බර් | 3,244,550.51 | 6,652,667.00 |
| 12. | දෙසැම්බර් | 3,072,193.51 | 3,106,196.00 |
| | **එකතුව** | **33,714,724.24** | **34,146,666.00** |

උත්සව අත්තිකාරම් ලැබීමට හිමිකම් ඇති නිලධාරීන් ගණන 1,675

විශේෂ අත්තිකාරම් ලැබීමට හිමිකම් ඇති නිලධාරීන් ගණන 1,575

ආපදා ණය ලැබීමට හිමිකම් ඇති නිලධාරීන් ගණන 1,675

# 6. විභාග අංශය

**විභාග අංශයේ කාර්ය භාරය**

- ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලයේ අනුමැතිය ඇතිව ආයුර්වේද ශාස්ත්‍රී විද්‍යාල ලියාපදිංචිය සඳහා පරීක්ෂක මණ්ඩල පත් කිරීම, විද්‍යාල පවත්වාගෙන යාම සහ ලියාපදිංචි විද්‍යාල සඳහා ආධාර මුදල් ලබා දීම.

- ආයුර්වේද ශාස්ත්‍රී පරික්ෂණය සඳහා සිසුන් ලියාපදිංචි කිරීම සඳහා සම්මුඛ පරික්ෂණ පැවැත්වීම හා සුදුසුකම්ලත් සිසුන් ලියාපදිංචි කිරීම.

- ආයුර්වේද ශාස්ත්‍රී පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් සඳහා වාර්ෂික හා අතිරේක පරික්ෂණ පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.

- ආයුර්වේද උපස්ථායක උපස්ථායිකාවන් හා සම්බාහනකරුවන් සඳහා වූ ත්‍රෛමාසික පාඨමාලාව අවසානයේ විභාග පැවැත්වීම.

- ආයුර්වේද හෙද හෙදියන් බඳවා ගැනීම සඳහා විභාග පැවැත්වීම, බඳවා ගන්නා ලද හෙදියන් සඳහා වර්ෂ අවසානයේ විභාග පැවැත්වීම.

- ලංකා සිද්ධ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ (යාපනය) අවසාන වසර සිසුන්ගේ ලිඛිත හා වාචික පරික්ෂණ පැවැත්වීම.

- ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම.

- ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම.

- ආයුර්වේදය සමඟ බැඳුණු ජ්‍යොතිෂ්‍ය හා යාතුකර්ම පිළිබඳ පාඨමාලාව අවසානයේ විභාග පැවැත්වීම.

- ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරු වලට බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා විභාග පැවැත්වීම.

**2015 ප්‍රගතිය - විභාග අංශය**

**වැඩසටහන/ ව්‍යාපෘතිය/ වැය ශීර්ෂය** 220-2-4-1405

**2015 වර්ෂයේ ඇස්තමේන්තු මුදල** රු.2,500,000.00

| අනු අංකය | අයිතමය | ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | විභාග පැවැත්වීම | ආයුර්වේද ශාස්ත්‍රී පරීක්ෂණ සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, සිසුන් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම. | ලියාපදිංචි වූ සිසුන් ගණන - 321 |
| 2 | | ආයුර්වේද ශාස්ත්‍රී වාර්ෂික හා අතිරේක පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම. | ආයුර්වේද ශාස්ත්‍රී වාර්ෂික පරීක්ෂණය-2014 නොවැම්බර් මස පැවැත්විය යුතු වාර්ෂික පරීක්ෂණය, 2015 ජනවාරි මස හා 2014 අතිරේක පරීක්ෂණය, 2015 නොවැම්බර් මස පවත්වන ලදී.<br>**1.** 2014 වාර්ෂික (2015 ජනවාරි) - සිසුන් සංඛ්‍යාව - 627<br>**2.** 2014 අතිරේක (2015 නොවැම්බර්) - සිසුන් සංඛ්‍යාව - 378 |
| 3 | | ලංකා සිද්ධ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ අවසාන වසර සිසුන් සඳහා විභාග පැවැත්වීම (දෙමළ මාධ්‍ය). | සාම්ප්‍රදායික සිද්ධ වෛද්‍ය ක්‍රමයේ ප්‍රවීණ වෛද්‍යවරුන් බිහි කිරීම - 2015 පරීක්ෂණය සිසුන් සංඛ්‍යාව - 12 |
| 4 | | ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම. | • ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා (දෙමළ වාචික පරීක්ෂණය) අයදුම්කරුවන් ගණන - 141<br>• ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් හා අන්තර්ග්‍රහණය කරන ලද ප්‍රජා වෛද්‍ය සහකාර නිලධාරීන් සඳහා- අයදුම්කරුවන් ගණන - 520 |
| 5 | | උපස්ථායක, ඖෂධ සංයෝජක, සම්බාහක පාඨමාලා සහ පංචකර්ම උසස් සහතික පත්‍ර පාඨමාලාවට අදාළ වන අවසාන ඇගයීම් පරීක්ෂණ පැවැත්වීම. | ඖෂධ සංයෝජක පුහුණු පාඨමාලාවන් පැවැත්වීම<br>**1.** සිංහල මාධ්‍ය අයදුම්කරුවන් - 31<br>**2.** දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් - 36 |

| | | | |
|---|---|---|---|
| 6 | | ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩල රැස්වීම්, විභාග පාලක මණ්ඩල රැස්වීම් හා අනු කමිටුවලින් ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීම. | ආයුර්වේද පනත යටතේ ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලයට පැවරී ඇති වගකීම් ඉටු කිරීම.<br><br>පැවැත්වූ රැස්වීම්<br>- ආරෝග්‍යශාලා මණ්ඩල රැස්වීම් වාර - 6<br>- විභාග පාලක රැස්වීම් - 4<br>- අනු කමිටු රැස්වීම් - 1<br><br><u>රැස්වීම් මඟින් ගන්නා ලද තීරණ</u><br>• පෞද්ගලික අධ්‍යාපන ආයතන නියාමනය කිරීම සුදුසු බව තීරණය වූ අතර, ඒ සඳහා කමිටුවක් පත් කරන ලදී.<br>• ආයුර්වේද ශාස්ත්‍රී පරීක්ෂණයේ 2017 වසර සඳහා නව විෂය නිර්දේශයක් සකස් කිරීමට තීරණය විය.<br>• ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය මඟින් ගනු ලබන තීරණ ගැන සාකච්ඡා කිරීම සඳහා මාස 3 කට වරක් ගරු ඇමතිතුමා සමඟ සාකච්ඡාවක් පැවැත්විය යුතු බවට මණ්ඩලයේ සාමාජිකයන් විසින් තීරණය කරන ලදී.<br>• ආයුර්වේද ශාස්ත්‍රී අවසාන පරීක්ෂණය සමත් වන සිසුන් සඳහා ආයුර්වේද විෂයට අදාළව ඉංග්‍රීසි පාඨමාලාවක් පැවැත්වීම සුදුසු බව තීරණය විය. |
| 7 | | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරුවලට උසස් කිරීම සඳහා විභාග පැවැත්වීම. | ආයුර්වේද වෛද්‍යවරුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම. |
| 8 | | ආයුර්වේද ශාස්ත්‍රී පාඨමාලාව පැවැත්වීම සඳහා ආයුර්වේද විද්‍යාල පවත්වාගෙන යාම හා එම විද්‍යාල සඳහා වාර්ෂිකව ආධාර මුදල් ප්‍රදානය කිරීම. | දේශීය වෛද්‍ය ක්‍රමය දිවයින පුරා ප්‍රචලිත කිරීම හා ගුණාත්මක වෛද්‍යවරුන් බිහි කිරීම.<br>ආයුර්වේද වෛද්‍ය විද්‍යාල 18ක් සඳහා රු.1,625,000.00 මුදලක් ආධාර වශයෙන් ලබා දීම. |

## 7. බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල



**බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල පිළිබඳ හැඳින්වීම**

වර්ෂ 1910 දී පමණ අනගාරික ධර්මපාලතුමා විසින් මහා බෝධි සමාගම යටතේ පෝස්ටර් රොබින්සන් පුණ්‍යශාලාව නම් ආයුර්වේද රෝහලක් ආරම්භ කර පවත්වාගෙන යන ලද බවට ඉතිහාසගත තොරතුරු ඇත.

පසුව, 1929 ජූනි 10 වැනි දින බොරැල්ල කොටා පාරේ කුලියට ගන්නා ලද බවර් ගොඩනැගිල්ලේ, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය හා රෝහල ආරම්භ වී ඇති අතර, එය විවෘත කර ඇත්තේ ගරු හර්බට් ස්ටැන්ලි ආණ්ඩුකාරවරයා විසිනි.

මෙම ස්ථානයේ සීමාකාරී ඉඩකඩ ප්‍රධාන බාධාවක් වූ බැවින්, රජයේ ද පෞද්ගලික අංශයේ ද ආධාර ඇතිව, ඔබේසේකරපුර බටහිර දකුණු මායිමේ රේන්දපොළ හන්දිය අසල ඉඩමක් ලබා දී, 1931 අවසාන භාගයේ දී නව විද්‍යාල ගොඩනැගිල්ල හා ආරෝග්‍ය ශාලාව සඳහා වර්ග අඩි 21,216 ක බිමක් සහිතව බොරැල්ල ආයුර්වේද රෝහල ආරම්භ වී ඇත. (අක්කර 06 පර්. 47ක භූමි භාගයක් අයත්ව තිබූ බවට ද තොරතුරු ඇත.)

බාහිරාංශ සාමාන්‍ය ප්‍රතිකාර, පාරම්පරික දේශීය වෛද්‍ය ප්‍රතිකාර, බාහිරාංශ විශේෂඥ සායන, කොරියානු කටු චිකිත්සා ප්‍රතිකාර, නේවාසික ප්‍රතිකාර සේවා සැපයීම, වෛද්‍ය සිසුන්ගේ ශික්ෂණ කටයුතු සඳහා පහසුකම් සැපයීම, පශ්චාත් උපාධි අපේක්ෂකයින්ගේ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැපයීම, ඖෂධ නිෂ්පාදනය ආදී ක්ෂේත්‍ර යටතේ රෝහල වර්තමානයේ සිය වගකීම් හා කාර්යයන් සමාජය වෙත ඉටු කරමින් පවතී.

**රෝහලේ බාහිර අංශය, නේවාසික අංශය හා ඖෂධ නිෂ්පාදනාගාරය ලෙස අංශ තුනක් ඇත.**

- **බාහිර අංශය**

රෝහලට පැමිණෙන රෝගීන්ගේ රෝග නිරීක්ෂණය කර, සායනවලට යොමු කිරීමත්, නේවාසික ප්‍රතිකාර සඳහා යොමු කිරීමත් සිදුකරයි.

- **නේවාසික අංශය**

බාහිරාංශය මඟින් නේවාසික අංශය වෙත යොමු කරන ලද රෝගීන්, වාට්ටුවලට ඇතුළත් කිරීමෙන් පසු ප්‍රතිකාර ලබා දීම.

- **ඖෂධ නිෂ්පාදනාගාරය**

රෝහලට අවශ්‍ය ඖෂධ නිෂ්පාදනය කිරීම සිදු කරයි.

**සේවක සංඛ්‍යා තොරතුරු- 2015**

| අනු අංකය | තනතුර | තත්‍ය තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | අධ්‍යක්ෂ | 01 |
| 2. | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| 3. | ආයුර්වේද වෛද්‍ය නිලධාරී (විශේෂඥ) | 13 |
| 4. | ආයුර්වේද වෛද්‍ය නිලධාරී<br>➢ ආයුර්වේද<br>➢ සිද්ධ<br>➢ යුනානි | <br>98<br>06<br>14 |
| 5. | විශේෂ වෛද්‍ය (තාවකාලික) | 05 - පූර්ණ කාලීන (සතියට දින 6ක් සේවයේ යෙදේ.)<br>03 - අර්ධ කාලීන (සතියට දින 2ක් සේවයේ යෙදේ.) |
| 6. | හෙදි පාලිකා (විශේෂ) | - |
| 7. | පරිපාලන නිලධාරී | - |
| 8. | හෙදි නිලධාරී<br>කොන්ත්‍රාත් හෙදි | 28<br>03 |
| 9. | කළමනාකරණ සහකාර | 08 |
| 10. | වෛද්‍ය පර්යේෂණ කාර්මික ශිල්පී | 01 |
| 11. | රසායනාගාර කාර්මික ශිල්පී | - |
| 12. | සම්බාහනකරු | 02 |
| 13. | සම්බාහනකාරිනී | 03 |
| 14. | භෛෂජ්ජක | 11 |
| 15. | පවුල් සෞඛ්‍ය සේවිකා | - |
| 16. | සුළු සේවා පාලක | 03 |
| 17. | භෞත චිකිත්සක | - |
| 18. | රෝහල් ලිපිකරු<br>(වාට්ටු, ටිකට්, ලිනන් ලිපිකරු) | 08 |
| 19. | විද්‍යුත් බන්තු රේඛන ශිල්පී | - |
| 20. | විකිරණ ශිල්පී | 01 |
| 21. | රියදුරු | 02 |
| 22. | ඖෂධ සංයෝජක | 15 |
| 23. | ආහාර නිරීක්ෂක | 03 |
| 24. | යන්ත්‍ර ක්‍රියාකරු | 04 |

| | | |
|---|---|---|
| 25. | අරක්කැමි | 03 |
| 26. | උපස්ථායක/උපස්ථායිකා | 72 |
| 27. | රසායනාගාර සේවක | 01 |
| 28. | වඩු කාර්මික | 01 |
| 29. | රෝහල් සහායක | 91<br>ආයු.සේවා සහායක - 83<br>බෙහෙත්ශාලා කම්කරු - 8 |

**රෝගී සංඛ්‍යා ලේඛන - 2015**

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | වාට්ටු සංඛ්‍යාව | 13 |
| 2 | ඇඳන් සංඛ්‍යාව | 190 |
| 3 | බාහිරාංශ ප්‍රතිකාර ලැබූ රෝගීන් සංඛ්‍යාව | 213,105 |
| 4 | නේවාසිකව ප්‍රතිකාර ලැබූ රෝගීන් සංඛ්‍යාව | 2,130 |

**නිෂ්පාදන ධාරිතාව - 2015**

| අනු අංකය | වර්ගය | ප්‍රමාණය | |
|---|---|---|---|
| | | බෝතල් | කි. ග්‍රෑම් |
| 1. | ක්වාථ | 74,500 | - |
| 2. | අරිෂ්ඨ හා ආසව | 7,493 | - |
| 3. | ගුලි / කල්ක | - | 1,871.110 |
| 4. | චූර්ණ වර්ග | - | 5,369.55 |
| 5. | තෛල වර්ග | 10,005 | - |
| 6. | යුනානි ඖෂධ<br>➢ තෛල වර්ග<br>➢ චූර්ණ / කල්ක / ලේප | 1,804 | 1,627.950 |
| 7. | සිද්ධ ඖෂධ<br>➢ තෛල වර්ග<br>➢ චූර්ණ | 106 ½ | 105.082 |
| 8. | ක්ෂාර නූල්<br>ක්ෂාර චූර්ණ | 395 | 0. 255 |

# 8. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල (ශික්ෂණ) - යක්කල




**හැඳින්වීම**

| | |
|---|---|
| ආරම්භය | 1984 ජූනි<br>(එවකට රෝහලේ ඇඳන් සංඛ්‍යාව 40 සහ වාට්ටු 02) |
| දිස්ත්‍රික්කය | ගම්පහ |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ගම්පහ |
| නේවාසික ප්‍රතිකාර සඳහා ඇති වාට්ටු ගණන | 04 |
| ඇඳන් සංඛ්‍යාව | 107 |

**2015 රෝහල් ව්‍යුහය**

1. රෝහල් කාර්යාලය
2. බාහිර රෝගී අංශය
3. නේවාසික රෝගී අංශය
   - ගැහැණු වාට්ටු 2
   - පිරිමි වාට්ටු 2
4. රසායනාගාරය
5. ඖෂධ නිෂ්පාදනාගාරය
6. මුළුතැන්ගෙය
7. ඖෂධ ගබඩාව
8. යන්ත්‍රාගාරය

**සේවක සංඛ්‍යා තොරතුරු - 2015**

| අනු අංකය | තනතුර | ස්ථිර | අනුයුක්ත |
|---|---|---|---|
| 1. | වෛද්‍ය නිලධාරී | 14 | 04 |
| 2. | හෙද/හෙදි නිලධාරී | 17 | - |
| 3. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | - |
| 4. | සංවර්ධන සහකාර | - | 01 |
| 5. | සංවර්ධන නිලධාරී | 02 | - |
| 6. | සුළු සේවා පාලක | 01 | - |
| 7. | භෛෂජ්ජක | 03 | 01 |
| 8. | උපස්ථායක/උපස්ථායිකා | 22 | - |
| 9. | අරක්කැමි | 02 | - |
| 10. | ඖෂධ සංයෝජක | 02 | - |
| 11. | ටිකට් ලිපිකරු | 01 | - |
| 12. | යන්ත්‍ර ක්‍රියාකරු | 01 | - |
| 13. | ආයුර්වේද සේවා සහායක | 36 | 01 |
| | **එකතුව** | **103** | **07** |

**බාහිර රෝගී සංඛ්‍යා ලේඛන -2015**

| අනු අංකය | මාසය | බාහිර රෝගීන් සංඛ්‍යාව | ජ්‍යෝෂ්ඨ පුරවැසි සායන රෝගීන් සංඛ්‍යාව | ජංගම සායන රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | ජනවාරි | 4,419 | 51 | - |
| 2. | පෙබරවාරි | 4,670 | 63 | 224 |
| 3. | මාර්තු | 5,189 | 59 | 103 |
| 4. | අප්‍රේල් | 3,872 | 56 | - |
| 5. | මැයි | 4,411 | 47 | - |
| 6. | ජුනි | 4,862 | 57 | 240 |
| 7. | ජූලි | 3,809 | 80 | - |
| 8. | අගෝස්තු | 5,540 | 79 | 53 |
| 9. | සැප්තැම්බර් | 5,241 | 91 | 74 |
| 10. | ඔක්තෝම්බර් | 4,916 | 57 | 76 |
| 11. | නොවැම්බර් | 2,800 | 112 | 401 |
| 12. | දෙසැම්බර් | 5,180 | 59 | 126 |
| | **එකතුව** | **54,909** | **811** | **1,297** |

**නේවාසිකව ප්‍රතිකාර ලැබූ රෝගී සංඛ්‍යා ලේඛන -2015**

| අනු අංකය | මාසය | වාට්ටු 3 | වාට්ටු 4 | වාට්ටු 5 | වාට්ටු 6 | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1. | ජනවාරි | 17 | 14 | 25 | 22 | **78** |
| 2. | පෙබරවාරි | 18 | 9 | 13 | 14 | **54** |
| 3. | මාර්තු | 14 | 22 | 17 | 21 | **74** |
| 4. | අප්‍රේල් | 22 | 10 | 15 | 11 | **58** |
| 5. | මැයි | 26 | 24 | 24 | 27 | **101** |
| 6. | ජූනි | 25 | 18 | 25 | 19 | **87** |
| 7. | ජූලි | 26 | 22 | 20 | 21 | **89** |
| 8. | අගෝස්තු | 18 | 16 | 23 | 22 | **79** |
| 9. | සැප්තැම්බර් | 19 | 16 | 21 | 29 | **85** |
| 10. | ඔක්තෝම්බර් | 19 | 17 | 14 | 16 | **66** |
| 11. | නොවැම්බර් | 14 | 12 | 10 | 15 | **51** |
| 12. | දෙසැම්බර් | 21 | 22 | 19 | 18 | **80** |
| | එකතුව | **239** | **202** | **226** | **235** | **902** |

**නිෂ්පාදන ධාරිතාවය, ඖෂධ වර්ගයන් හා ප්‍රමාණයන් - 2015**

| අනු අංකය | ඖෂධ වර්ගයන් | ප්‍රමාණය | |
|---|---|---|---|
| | | බෝතල් | කිලෝ ග්‍රෑම් |
| 1. | ක්වාථ වර්ග 04 | 5,575 | - |
| 2. | පාණ්ඩ වර්ග 29 | - | 653.70 |
| 3. | චූර්ණ වර්ග 15 | - | 339.79 |
| 4. | අරිෂ්ඨ ආසව වර්ග 04 | 411 | - |
| 5. | තෛල වර්ග 05 | | |
| | * සර්ෂප තෛලය | 548 | - |
| | * පිණ්ඩ තෛල | 474 | - |
| | * නිර්ගුණ්ඩි තෛල | 51 | - |
| | * බිල්ව තෛල | 16 | - |
| | * ශූලහර තෛල | 40 | - |
| 6. | දශාංග ලේපය | - | 64.10 |
| 7. | නවරත්න කල්කය | - | 71.65 |
| 8. | ලාක්ෂාදී ලේපය | - | 76.70 |
| 9. | රෝහනේ කාෂ් | - | 8.00 |
| 10. | කෛශෝර ගුගුල් | - | 33.95 |
| 11. | ගෝක්ෂුර ගුගුල් | - | 45.60 |
| 12. | නේත්‍රා බිංදු | 36 | - |

## 9. සිද්ධ ශික්ෂණ රෝහල - කයිතඩි



සිද්ධ ශික්ෂණ රෝහල - කයිතඩි

### හැඳින්වීම

| | |
|---|---|
| බාහිර රෝගී අංශය විවෘත කළ දිනය | 1973.06.29 |
| වාට්ටු සංකීර්ණය විවෘත කළ දිනය | 1978.10.02 |
| වාට්ටු සංඛ්‍යාව | 5 |
| ඇඳන් සංඛ්‍යාව | 150 |

### සේවක සංඛ්‍යා තොරතුරු - 2015

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | වෛද්‍ය නිලධාරීන් | 11 |
| 2. | කළමණාකරන සහකාර | 03 |
| 3. | ඖෂධ සංයෝජක | 02 |
| 4. | ටිකට් ලිපිකරු | 01 |
| 5. | සුළු සේවා පාලක | 01 |
| 6. | උපස්ථායක | 10 |
| 7. | රියදුරු | 01 |
| 8. | අරක්කැමි | 01 |
| 9. | ආයුර්වේද සේවා සහායක | 26 |
| | **එකතුව** | **56** |

### රෝගී සංඛ්‍යා ලේඛණ - 2015

| අනු අංකය | මාසය | බාහිර රෝගීන් සංඛ්‍යාව | නේවාසික රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | ජනවාරි | 2,631 | 70 |
| 2. | පෙබරවාරි | 2,765 | 59 |
| 3. | මාර්තු | 3,249 | 114 |
| 4. | අප්‍රේල් | 2,779 | 83 |
| 5. | මැයි | 2,535 | 92 |
| 6. | ජුනි | 2,723 | 79 |
| 7. | ජුලි | 2,817 | 96 |
| 8. | අගෝස්තු | 2,846 | 123 |
| 9. | සැප්තැම්බර් | 2,902 | 120 |
| 10. | ඔක්තෝම්බර් | 2,810 | 103 |
| 11. | නොවැම්බර් | 2,150 | 61 |
| 12. | දෙසැම්බර් | 2,629 | 77 |
| | **එකතුව** | **32,836** | **1,077** |

**විවිධ සායන වලින් ප්‍රතිකාර ලැබූ රෝගීන් සංඛ්‍යාව - 2015**

| අනු අංකය | මාසය | වැඩිහිටි සායන | විශේෂ වෛද්‍ය ප්‍රතිකාර | නාරිවේදි සායන | දියවැඩියා සායන | ළමා | වෛද්‍ය සායන | ජංගම සායන | විශ්ව විද්‍යාල සායන | විශේෂ සායන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | ජනවාරි | 245 | 182 | 19 | 43 | 13 | 70 | 41 | 66 | 1 |
| 2. | පෙබරවාරි | 237 | 142 | 32 | 64 | 14 | 60 | 81 | 45 | 13 |
| 3. | මාර්තු | 196 | 142 | 25 | 53 | 14 | 83 | 50 | 36 | 15 |
| 4. | අප්‍රේල් | 230 | 129 | 20 | 58 | 36 | 65 | 71 | 35 | 13 |
| 5. | මැයි | 293 | 181 | 29 | 41 | 19 | 94 | 48 | 34 | 8 |
| 6. | ජුනි | 251 | 151 | 34 | 52 | 31 | 90 | 76 | 46 | 8 |
| 7. | ජූලි | 304 | 146 | 24 | 58 | 43 | 120 | 146 | 62 | 8 |
| 8. | අගෝස්තු | 240 | 164 | 43 | 43 | 23 | 108 | 72 | 73 | 13 |
| 9. | සැප්තැම්බර් | 375 | 136 | 30 | 63 | 23 | 140 | 41 | 109 | 22 |
| 10. | ඔක්තෝම්බර් | 402 | 171 | 42 | 44 | 27 | 122 | 78 | 91 | 13 |
| 11. | නොවැම්බර් | 173 | 124 | 43 | 47 | 19 | 126 | 95 | 61 | 13 |
| 12. | දෙසැම්බර් | 317 | 127 | 35 | 66 | 26 | 159 | 150 | 58 | 17 |
| | එකතුව | **3,263** | **1,795** | **376** | **632** | **288** | **1,237** | **949** | **716** | **144** |

**ඖෂධ නිෂ්පාදනය - 2015**

| අනු අංකය | ඖෂධ වර්ගය | ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| | | බෝතල් | කිලෝ ග්‍රෑම් | මිලි ලීටර |
| 1. | අශ්වගන්ධ චූර්ණය | - | 431.50 | - |
| 2. | මධුමේහ චූර්ණය | - | 66.55 | - |
| 3. | මාණිභද්‍ර චූර්ණය | - | 71 | - |
| 4. | මුඩක්කු චූර්ණය | - | 36.40 | - |
| 5. | ත්‍රිපලා චූර්ණය | - | 194 | - |
| 6. | අශෝක පට්ට චූර්ණය | - | 2.40 | - |
| 7. | සාදික්කා චූර්ණය | - | 2.65 | - |
| 8. | සිවද චූර්ණය | - | 95.50 | - |
| 9. | දශමූල චූර්ණය | - | 0.60 | - |
| 10. | මහාසීරක චූර්ණය | - | 3.50 | - |
| 11. | අට්ට චූර්ණය | - | 5.60 | - |
| 12. | මාදුලෛයි චූර්ණය | - | 2 | - |
| 13. | සුවාසකුඩාරි ගුලි | - | 1.10 | - |
| 14. | වෙල්ලවෙන්ගායම් ගුලි | - | 12.75 | - |
| 15. | කාකනවම් මාත්‍රා | - | 0.25 | - |
| 16. | උරෙයි මාත්‍රා | - | 0.60 | - |
| 17. | සින්න සිවප්පු ගුලි | - | 2.85 | - |

| | | | | |
|---|---|---|---|---|
| 18. | කඩුකුරෝහනි මාත්‍රා | - | 1.30 | - |
| 19. | කප්පුරාදි තෛලය | 14.50 | - | - |
| 20. | පොන්නක්කානි තෛලය | 280 | - | - |
| 21. | කිරන්දි තෛලය | 90 | - | - |
| 22. | පච්ච තෙල් | 22 | - | - |
| 23. | නිර්ගුණ්ඩියාදී තෙල් | 5 | - | - |
| 24. | නාරායන තෙල් | 8.50 | - | - |
| 25. | පිණ්ඩ තෙල් | 591 | - | - |
| 26. | සර්ෂපාදි තෙල් | 275 | - | - |
| 27. | කාදුනෛයි තෙල් | - | - | 750 |
| 28. | පුන්ගාවි චින්තුරම් | - | 1.30 | - |
| 29. | පඩිකලින්ගන චින්තුරම් | - | 0.42 | - |
| 30. | වංගු පස්පන් | - | 0.75 | - |
| 31. | නන්ඩුකල් පස්පන් | - | 0.20 | - |
| 32. | දෙසඳුන් කල්කය | - | 8.70 | - |
| 33. | ආඩතෝඩ පැණිය | 14 | - | |
| 34. | ප්‍රමිනෙයි | - | - | 2,150 |
| 35. | කන්දක රසායන | - | 1.50 | - |
| 36. | ඉදිවෙල්ලායි මෙලුකු | - | 1.10 | - |
| 37. | බෝන් මැරෝ පේස්ට් | - | 5.20 | - |
| 38. | රෝහන කාෂ් | - | 25 | - |

## 10. මන්වන්තොඩුවායි ආයුර්වේද රෝහල

2009.11.21 දින මධ්‍යම රජයට පවරා ගන්නා ලද මන්වන්තොඩුවායි ආයුර්වේද රෝහල, 2009.12.01 දින දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ, ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත නිල වශයෙන් පවරා ගන්නා ලදී.

**සේවක සංඛ්‍යා තොරතුරු -2015**

| අනු අංකය | තනතුරු | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | අධ්‍යක්ෂ | 01 |
| 2. | වෛද්‍ය නිලධාරී | 04 |
| 3. | උපස්ථායක | 01 |
| 4. | ආයුර්වේද සේවා සහායක | 15 |
| | එකතුව | **21** |

**රෝගී සංඛ්‍යා ලේඛන - 2015**

| අනු අංකය | මාසය | බාහිර රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ජනවාරි | 1,025 |
| 2. | පෙබරවාරි | 1,080 |
| 3. | මාර්තු | 1,372 |
| 4. | අප්‍රේල් | 1,130 |
| 5. | මැයි | 1,275 |
| 6. | ජුනි | 1,320 |
| 7. | ජූලි | 974 |
| 8. | අගෝස්තු | 1,300 |
| 9. | සැප්තැම්බර් | 1,236 |
| 10. | ඔක්තෝම්බර් | 1,190 |
| 11. | නොවැම්බර් | 1,050 |
| 12. | දෙසැම්බර් | 1,182 |
| | එකතුව | **14,134** |

## 11. ආයුර්වේද රෝහල - අම්පාර

2009 අගෝස්තු මස 19 වෙනි දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණයකට අනුව, නැගෙනහිර පළාත් සභාව සතුව තිබූ අම්පාර ආයුර්වේද රෝහල, 2009.12.01 දින මධ්‍යම රජයේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට පවරා ගන්නා ලදී.

වාට්ටු සංඛ්‍යාව 2

ඇඳන් සංඛ්‍යාව 24

**සේවක සංඛ්‍යා තොරතුරු - 2015**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | රෝහල් අධ්‍යක්ෂ | 01 |
| 2. | වෛද්‍ය නිලධාරීන් | 03 |
| 3. | පාරම්පරික වෛද්‍ය නිලධාරීන් | 03 |
| 4. | භෛසජ්ජක | 01 |
| 5. | සුළු සේවා පාලිකා | 01 |
| 6. | ඖෂධ සංයෝජක | 02 |
| 7. | උපස්ථායක/උපස්ථායිකා | 08 |
| 8. | ආයුර්වේද සේවා සහායක | 15 |
| | **එකතුව** | **34** |

**ඖෂධ නිෂ්පාදනය - 2015**

| අනු අංකය | ඖෂධ වර්ගය | ප්‍රමාණය | |
|---|---|---|---|
| | | බෝතල් | ඇසුරුම් |
| 1. | නිර්ගුණ්ඩියාදී තෛලය | 11 | - |
| 2. | ත්‍රිඵලා චූර්ණය (ග්‍රෑම් 500) | - | 39 |
| 3. | තාලිසාදිය චූර්ණය (ග්‍රෑම් 500) | - | 16 |
| 4. | ධාත්‍රී චූර්ණය (ග්‍රෑම් 500) | - | 46 |
| 5. | සර්ෂපාදි තෛලය | 223 | - |
| 6. | ද්‍රාක්ෂාරිෂ්ටය | 19 | - |

**රෝගී සංඛ්‍යා ලේඛන -2015**

| අනු අංකය | මාසය | බාහිර රෝගීන් සංඛ්‍යාව | නේවාසික රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | ජනවාරි | 2,169 | 22 |
| 2. | පෙබරවාරි | 2,169 | 17 |
| 3. | මාර්තු | 2,320 | 13 |
| 4. | අප්‍රේල් | 1,920 | 16 |
| 5. | මැයි | 2,335 | 17 |
| 6. | ජුනි | 2,552 | 24 |
| 7. | ජූලි | 2,307 | 23 |
| 8. | අගෝස්තු | 2,132 | 15 |
| 9. | සැප්තැම්බර් | 2,291 | 21 |
| 10. | ඔක්තෝම්බර් | 2,255 | 14 |
| 11. | නොවැම්බර් | 1,990 | 18 |
| 12. | දෙසැම්බර් | 2,218 | 12 |
| | එකතුව | **26,658** | **212** |

# 12. සිද්ධ ශික්ෂණ රෝහල- ත්‍රිකුණාමලය

| | |
|---|---|
| බාහිර රෝගී අංශය පවරා ගත් දිනය | 2009.07.06 |
| වාට්ටු විවෘත කළ දිනය | 2015.07.11 |
| වාට්ටු සංඛ්‍යාව | 2 |
| ඇඳන් සංඛ්‍යාව | 10 |

**බාහිර රෝගී සංඛ්‍යා ලේඛන - 2015**

| අනු අංකය | මාසය | බාහිර රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ජනවාරි | 1,696 |
| 2. | පෙබරවාරි | 1,992 |
| 3. | මාර්තු | 2,360 |
| 4. | අප්‍රේල් | 2,336 |
| 5. | මැයි | 2,560 |
| 6. | ජූනි | 2,740 |
| 7. | ජූලි | 3,740 |
| 8. | අගෝස්තු | 4,412 |
| 9. | සැප්තැම්බර් | 4,556 |
| 10. | ඔක්තෝම්බර් | 4,272 |
| 11. | නොවැම්බර් | 3,364 |
| 12. | දෙසැම්බර් | 4,452 |
| | **එකතුව** | **38,480** |

- නේවාසිකව ප්‍රතිකාර ලැබූ රෝගීන් සංඛ්‍යාව 56
- සායන වලින් ප්‍රතිකාර ලැබූ රෝගීන් සංඛ්‍යාව

| අනු අංකය | සායනය | රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | චර්ම රෝග | 2,173 |
| 2. | සන්ධි රෝග | 2,781 |
| 3. | දියවැඩියා රෝග | 814 |
| 4. | අධ්‍යාතති රෝග | 947 |
| 5. | ශ්වසන රෝග | 2,326 |

# 13. බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය




| | |
|---|---|
| ආරම්භය | 1962.10.14 |
| දිස්ත්‍රික්කය | කොළඹ |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | මහරගම |
| නේවාසික ප්‍රතිකාර ලැබීම් සඳහා ඇති වාට්ටු ගණන | 4 |
| ඇඳන් සංඛ්‍යාව | 71 |

**සේවක සංඛ්‍යා තොරතුරු - 2015**

| අනු අංකය | කාර්ය මණ්ඩල තොරතුරු | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | අධ්‍යක්ෂ | 01 |
| 2. | වෛද්‍ය නිලධාරීන් | 35 |
| 3. | හෙද/හෙදි නිලධාරීන් | 10 |
| 4. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 07 |
| 5. | පර්යේෂණ සහකාර | 07 |
| 6. | සංවර්ධන සහකාර | 01 |
| 7. | රා.ක.ස III (තාක්ෂණික) | 02 |
| 8. | ලිපිකරු (ආයුර්වේද) | 01 |
| 9. | වාට්ටු ලිපිකරු | 01 |
| 10. | ටිකට් ලිපිකරු | 03 |
| 11. | සු.සේ.පාලක | 02 |
| 12. | රියදුරු | 03 |
| 13. | භෛසජ්ජක | 02 |
| 14. | සම්බාහක | 01 |
| 15. | ජලනල කාර්මික | 01 |
| 16. | විදුලි කාර්මික | 01 |
| 17. | යන්ත්‍ර ක්‍රියාකරු | 03 |
| 18. | කා.කා.ස | 01 |
| 19. | රසායනාගාර සේවක | 03 |
| 20. | ආයුර්වේද සේවා සහායක | 41 |
| 21. | උපස්ථායක | 11 |
| 22. | අරක්කැමි | 01 |
| 23. | බෙහෙත් ශාලා කම්කරු | 01 |
| | **එකතුව** | **139** |

බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය,

- රෝගී ප්‍රතිකාර සඳහා,
    - බාහිර රෝගී අංශය
    - නේවාසික අංශය
- ප්‍රමිතිකරණ අංශය
- උද්භිද විද්‍යා අංශය
- ඖෂධ නිෂ්පාදන අංශය
- සාහිත්‍ය පර්යේෂණ අංශය යන අංශයන්ගෙන් සමන්විත වේ.

**රෝගී සංඛ්‍යා ලේඛන -2015**

| අනු අංකය | මාසය | බාහිර රෝගීන් සංඛ්‍යාව | නේවාසික රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | ජනවාරි | 5,408 | 116 |
| 2. | පෙබරවාරි | 5,487 | 111 |
| 3. | මාර්තු | 5,833 | 95 |
| 4. | අප්‍රේල් | 4,476 | 93 |
| 5. | මැයි | 5,366 | 82 |
| 6. | ජූනි | 5,328 | 102 |
| 7. | ජූලි | 5,830 | 108 |
| 8. | අගෝස්තු | 5,987 | 111 |
| 9. | සැප්තැම්බර් | 5,404 | 98 |
| 10. | ඔක්තෝම්බර් | 5,588 | 88 |
| 11. | නොවැම්බර් | 4,730 | 94 |
| 12. | දෙසැම්බර් | 4,987 | 82 |
| | එකතුව | **64,424** | **1,180** |

**ප්‍රමිතිකරණ අංශය**

- **පර්යේෂණ කටයුතු**

1. වෙළෙඳපොළේ බහුලවම අලෙවි වන අරිෂ්ඨ/ආසව වර්ග 6ක් තෝරා ගෙන, ඒවායේ බැරලෝහ ප්‍රතිශතය ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කිරීම
2. වෙළෙඳපොළේ බහුලවම අලෙවි වන අරිෂ්ඨ/ආසව සාම්පල 6ක භෞතික රසායනික විශ්ලේෂණ සම්බන්ධ පර්යේෂණ කටයුතු තව දුරටත් සිදු කරමින් පවතී.
3. වෙළෙඳපොළේ බහුලවම භාවිත වන අරිෂ්ඨ/ආසව වල මද්‍යසාර ප්‍රතිශතය නිර්ණය කිරීමේ විශ්ලේෂණ කටයුතු **GCMS** උපකරණය ආශ්‍රිතව සිදු කිරීමට සැලසුම් කළ නමුත්, **GCMS** උපකරණයට අත්‍යාවශ්‍ය අමතර උපාංග කිහිපයක් මිලදී ගැනීම ප්‍රමාද වූයෙන් පර්යේෂණ කටයුතු අඩාල වී ඇත.
4. සුදු හඳුන් ශාකයේ වයස සහ පරිසරය අනුව රසායනික සංඝටක සංයුතිය සොයා බැලීමේ පර්යේෂණයද සැලසුම් කරන ලද්දේ **GCMS** උපකරණය ආශ්‍රිතව සිදු කිරීමට බැවින්, එම පර්යේෂණ කටයුතුද අඩාල වී ඇත.

- **සපයන ලද සේවාවන්**

1. ප්‍රායෝගික පුහුණු වෛද්‍යවරුන්ගේ පර්යේෂණ කටයුතු සඳහා විද්‍යාගාර පහසුකම් සහ එම පර්යේෂණ සිදු කරගෙන යෑම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.
   එම පර්යේෂණ පහත දැක්වේ.
   i. සීම්ග චූර්ණයේ භෞතික රසායනික විශ්ලේෂණ අධ්‍යයනය (ආයතනය තුළ නිෂ්පාදිත සාම්පල 2ක් සඳහා)
   ii. පුන්ගාවි චෙන්දූරම් සිද්ධ ඖෂධයෙහි ප්‍රාථමික ප්‍රමිතිකරණ විශ්ලේෂණය
   iii. වැල් කහඹිලියා කළං 12 ඖෂධයේ වෙනස් ආකාර නිෂ්පාදන 5ක සංසන්දනාත්මක අධ්‍යයනය
   iv. කෂාර්ව් චූර්ණයේ මූලික රසායනික විශ්ලේෂණය
   v. TKP පාණ්ඨ, කෂාය සහ පාණ්ඨකෂාය යන ඖෂධ 3ක් සඳහා තුනී පටල වර්ණලේඛ ක්‍රම (Thin layer chromatororgraphy) මගින් සංසන්දනාත්මක අධ්‍යයනය
   vi. පච්චෙයි එන්නෙයි ඖෂධයන්හි මූලික භෞත-රසායනික විශ්ලේෂණය
   vii. වෙල්ලයි වෙන්ගායා ඖෂධයන්හි මූලික භෞත-රසායනික විශ්ලේෂණය
   viii. භුක්ත පාත චූර්ණය නිෂ්පාදනය හා එහි මූලික ප්‍රමිතිකරණ විශ්ලේෂණය අධ්‍යයනය
   ix. ඉත්රිෆිල්-කෂින් යුනානි ඖෂධයේ භෞත-රසායනික විශ්ලේෂණය

**2.** බාහිර ආයතන මඟින් ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද ඖෂධ වල පරීක්ෂණ කටයුතු සිදු කොට ඊට අදාළ පර්යේෂණ වාර්තා ලබා දීම.

i. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
ii. කුරුණෑගල මහේස්ත්‍රාත් උසාවිය
iii. Oslark (pvt) Ltd ආයතනය
iv. වලස්මුල්ල මහෙස්ත්‍රාත් අධිකරණය
v. වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව
vi. පර්යේෂණායතන ඖෂධ නිෂ්පාදනාගාරයෙන් ලැබෙන විවිධ සාම්පල
vii. අධ්‍යක්ෂතුමන් සහ කොමසාරිස්තුමන් විසින් අප වෙත යොමු කරන ලද විවිධ සාම්පල පරික්ෂාව

3. බාහිරෙන් පැමිණෙන කණ්ඩායම් සඳහා ඖෂධ ප්‍රමිතිකරණය සහ තත්ව පාලනය පිළිබඳ දේශන පැවැත්වීම.

උද්භිද විද්‍යා අංශය

| අනු අංකය | ක්‍රියාකාරකම් | ප්‍රතිලාභ | ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | **ඖෂධීය ශාක හඳුනා ගැනීම** | ඖෂධීය ශාක නිවැරදිව හඳුනා ගැනීම | |
| | අ) වියළි ශාකාගාරය යාවත්කාලීන කිරීම | | වියළි ශාකාගාරයේ 75% පමණ යාවත්කාලීන කර ඇත. |
| | ආ) ඖෂධ උද්‍යානය සැකසීම | | - උද්‍යානයේ තෝරාගත් ස්ථානවල අලංකරණ කටයුතු සිදු කර ඇත.<br>- ඖෂධීය ශාක නාමපුවරු අලුතින් සකස් කිරීම<br>- ශාක 56ක් ඉවත් කර ඇති ස්ථානවල නව ශාක ස්ථාපනය කර ඇත. |
| | ඇ) උද්‍යානයේ ඖෂධීය ශාක සඳහා දත්ත බැංකුවක් ස්ථාපනය කිරීම | | ශාක නම් කිරීමට අදාළ මූලික ක්‍රියාකාරකම් සිදු කර ඇත. |
| 2 | **වියළි ශාක අමුද්‍රව්‍ය හඳුනා ගැනීම** | ප්‍රමිති ඖෂධ නිෂ්පාදනය | |
| | අ) සායනික පර්යේෂණ සඳහා ප්‍රමිති ඖෂධ හඳුනා ගැනීම | | |
| | ආ) විවිධ පරිසර තුළ වැඩෙන ලුණුවිල ශාකයේ බැරලෝහ අවශෝෂණය පිළිබඳ ප්‍රමාණාත්මක විශ්ලේෂණය | | පර්යේෂණ අවසන් කර පර්යේෂණ පත්‍රිකාවක් එළි දක්වා ඇත. |
| | ඇ) විවිධ වර්ධක අවස්ථාවල ඇති කුඹුක් පොතුවල රසායනික වෙනස්වීම් විශ්ලේෂණාත්මකව අධ්‍යයනය | | පර්යේෂණය අවසන් කර පර්යේෂණ පත්‍රිකාවක් එළි දක්වා ඇත. |
| | ඈ) මතභේදාත්මක ඖෂධ අමුද්‍රව්‍ය වන හීං නෙරෙංචි, ඇත් නෙරෙංචි, ගොකටු ශාකවල පටක විද්‍යාත්මක හා රසායන විද්‍යාත්මක විශ්ලේෂණ | | පර්යේෂණ අවසන් කර ඇත. |
| | ඉ) රත් හඳුන් පිළිබඳ වෙළෙඳපොළ සමීක්ෂණ හා ඒවායේ පටක විද්‍යාත්මක, රසායන විද්‍යාත්මක අධ්‍යයනයන් තුළින් නිවැරදිව හඳුනා ගැනීම | | පර්යේෂණය පළමු අදියර අවසන් කර පර්යේෂණ පත්‍රිකාවක් එළි දක්වා ඇත. |
| 3 | වගා පර්යේෂණ<br>පටක රෝපණ පර්යේෂණ | ඖෂධීය ශාක සංරක්ෂණය හා ප්‍රචාරණය | - |
| 4. | **දැනුවත් කිරීමේ වැඩසටහන්**<br>විවිධ දේශන, වැඩමුළු හා ප්‍රදර්ශන මගින් ඖෂධ පැළෑටි පිළිබඳ දැනුවත් කිරීම හා ඔසු උයන් ස්ථාපිත කිරීමට උපදේශන සේවා සැපයීම | ඖෂධ පැළෑටි පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම මගින් ඒවා සංරක්ෂණය කිරීම | 100% |

**ඖෂධ නිෂ්පාදන තොරතුරු -2015**

| අනු අංකය | ඖෂධයේ නම | නිෂ්පාදිත ප්‍රමාණය | ඒකකයක වටිනාකම (රු.) | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 1. | අරළු කොල්ලු ආදී පාන්ඨය (60g) | පැකට් 118 | මිල තීරණය කර නොමැත. | |
| 2. | අරවින්ද ආසවය | බෝතල් 270 | 240.00 | 64,800.00 |
| 3. | අශ්වගන්දා චූර්ණය | කි.ග්‍රෑම් 81.30 | 1,000.00 | 81,300.00 |
| 4. | ආමලකී චූර්ණය | කි.ග්‍රෑම් 75.37 | | |
| 5. | කළුදුරු චූර්ණය | කි.ග්‍රෑම් 28.60 | | |
| 6. | බදරා ලේපය (70g) | පැකට් 1,552 | මිල තීරණය කර නොමැත. | |
| 7. | ගුඩුච්‍යාදී චූර්ණය | කි.ග්‍රෑම් 20 | | |
| 8. | චීන අල චූර්ණය | කි.ග්‍රෑම් 28.90 | | |
| 9. | තාලිසාදී චූර්ණය | කි.ග්‍රෑම් 60 | 860.00 | 51,600.00 |
| 10. | ත්‍රිඵලා ලේපය (70g) | පැකට් 119 | මිල තීරණය කර නොමැත. | |
| 11. | ත්‍රිඵලා ක්වාථය | බෝතල් 42,168 | 280.00 | 11,807,040.00 |
| 12. | ත්‍රිඵලා කතකං කෂාය (60g) | පැකට් 4,558 | මිල තීරණය කර නොමැත. | |
| 13. | ත්‍රිඵලා ඝෘතය 400g | ජෑ.බෝ 7 | | |
| 14. | ත්‍රිඵලා චූර්ණය | කි.ග්‍රෑම් 163.36 | 1,080.00 | 176,428.80 |
| 15. | ත්‍රිඵල් නේත්‍ර බිංදු | බෝතල් 172 | මිල තීරණය කර නොමැත | |
| 16. | දශාංගලේපය | කි.ග්‍රෑම් 39.60 | 1,610.00 | 63,756.00 |
| 17. | ධාත්‍රී චූර්ණය | කි.ග්‍රෑම් 294.07 | 700.00 | 205,849.00 |
| 18. | නිර්ගුණ්ඩ්‍යාදී තෛල | බෝතල් 243 | 1410.00 | 342,630.00 |
| 19. | නිශාදි චූර්ණය | කි.ග්‍රෑම් 19.83 | | |
| 20. | නේත්‍රපටල වර්ති | කරල් 2,120 | මිල තීරණය කර නොමැත. | |
| 21. | පච්චෙයි එන්නෙයි තෛලය | බෝතල් 5.75 | | |
| 22. | පිප්පල්‍යාදී ආසවය | බෝතල් 1,697 | 280.00 | 475,160.00 |
| 23. | පුණර්ණවාසවය | බෝතල් 1,126 | 240.00 | 270,240.00 |
| 24. | බිං තල් අල චූර්ණය | කි.ග්‍රෑම් 13.18 | මිල තීරණය කර නොමැත. | |
| 25. | භුක්තපාක චූර්ණය (60g) | පැකට් 68 | මිල තීරණය කර නොමැත. | |

| | | | | |
|---|---|---|---|---|
| 26. | මධුමේහය පෙති (56) | පැකට් 80 | | |
| 27. | මාණිභද්‍ර චූර්ණය | කි.ග්‍රෑම් 484.847 | 760.00 | 368,483.72 |
| 28. | ලේඛනාදි චූර්ණය | කි.ග්‍රෑම් 26.75 | | |
| 29. | ශතාවරී චූර්ණය | කි.ග්‍රෑම් 20.125 | | |
| 30. | ශිරා ග්‍රන්ථි ලේපය | පැකට් 5574 | මිල තීරණය කර නොමැත. | |
| 31. | සතකුප්ප චූර්ණය | කි.ග්‍රෑම් 45.95 | | |
| 32. | සුකුමාර චූර්ණය | කි.ග්‍රෑම් 61.70 | | |
| 33. | සර්ෂපාදී තෛලය | බෝතල් 488 | 820.00 | 400,160.00 |
| 34. | සෆුෆ - ඉ - සුරින්ජන් චූර්ණය (60g) | පැකට් 125 | | |
| 35. | හරීතකාදී වටී | කි.ග්‍රෑම් 43.50 | | |
| 36. | AN චූර්ණය (60g) | පැකට් 694.70 | | |
| 37. | CKD පර්යේෂණ චූර්ණය | පැකට් 87 | | |
| 38. | CT චූර්ණය (60g) | පැකට් 368 | | |
| 39. | DG වටී 50 | පැකට් 393.5 | | |
| 40. | DT 6 චූර්ණය (60g) | පැකට් 1,639 | | |
| 41. | HTN 6 චූර්ණය (60g) | පැකට් 917 | | |
| 42. | Ithrifal – e kashnee | පැකට් 33 | | |
| 43. | KL චූර්ණය (60g) | පැකට් 274 | මිල තීරණය කර නොමැත. | |
| 44. | P 8 චූර්ණය (60g) | පැකට් 985 | | |
| 45. | S 5 චූර්ණය (60g) | පැකට් 1,004 | | |
| 46. | S.P සිරප් | බෝතල් 12.25 | | |
| 47. | T.K.P. කෂාය (60g) | පැකට් 8,013 | | |
| 48. | T.K.P. චාණ්ඨය (60g) | පැකට් 2032 | | |
| 49. | T.S චූර්ණය | කි.ග්‍රෑම් 63.47 | | |
| 50. | UG චූර්ණය (60g) | පැකට් 176 | | |
| 51. | V වටී 250g | පැකට් 17 | | |
| 52. | WK චූර්ණය (60g) | පැකට් 596 | | |
| | එකතුව | | | **14,307,447.52** |

**සාහිත්‍ය පර්යේෂණ අංශයේ ප්‍රගතිය - 2015**

| අනු අංකය | යෝජිත කාර්යයන් | නිමකරන ලද කාර්යයන් | වැය වූ ප්‍රතිපාදන (රු.) | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| | **සාහිත්‍ය පර්යේෂණ අංශය** | | | |
| 01 | පුස්කොළ පොත් සංරක්ෂණ | පුස්කොළ පොත් සංරක්ෂණ අංශය ස්ථාපිත කිරීම | | සාහිත්‍ය අංශයට ලබාදුන් විද්‍යුත් උපකරණ සඳහා වැයවූ ප්‍රතිපාදන |
| 02 | පුස්කොළ පොත් 2 ක විමර්ශනය කිරීම | පුස්කොළ පොත් 1ක අත්පිටපත් සම්පූර්ණ කිරීම | - | ගෙඩි වණ පිළිකා දේශීය වට්ටෝරු මෙම පුස්කොළ පොතින් හඳුනාගෙන ඇත. |
| | **පුස්තකාල අංශය** | | | |
| 03 | වෛද්‍ය නිලධාරී සහ සීමාවාසික පුහුණු වෛද්‍ය නිලධාරීන්ගේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා තොරතුරු සම්පාදනයට සහාය වීම | සීමාවාසික පුහුණු වෛද්‍ය නිලධාරී 2015 1වන, 2වන, 3වන හා 4වන කණ්ඩායම් විසින් නිමකරන ලද පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව<br>- කණ්ඩායම් පර්යේෂණ වාර්තා - 41<br>- ඒක පුද්ගල පර්යේෂණ වාර්තා - 200 | | |
| 04 | ග්‍රන්ථ එකතුව යාවත්කාලීන කිරීම | ග්‍රන්ථ එකතුව පුස්තකාල විද්‍යානුකූලව සකස් කිරීම ආරම්භ කිරීම ග්‍රන්ථ පරිග්‍රහණ ලේඛනය සම්පූර්ණ කිරීමේ කටයුතු කිරීම | | මෙම කාර්ය කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යායතනයේ ජොෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිගේ අධීක්ෂණයෙන් සිදු කිරීම |
| 05 | ග්‍රන්ථ එකතුව 10 %කින් ඉහළ නැංවීම | අලුතින් මිලදීගත් වෛද්‍ය ග්‍රන්ථ හා වෙනත් පොත් සංඛ්‍යාව - 35 | රු.40,259.30 | |

- **රෝග නිධාන රසායනාගාරය නවීකරණය කළ පසු අවස්ථාව -** 2015.03.11





- **රෝග නිධාන විද්‍යාගාර පරීක්ෂණයන් සිදුකිරීම -** 2015.03.11



- බණ්ඩාරනායක අයුර්වේද පර්යේෂණායතනයේ වෙබ් අඩවිය දියත් කිරීමේ අවස්ථාව -2015.03.11



- ඖෂධ උයන හා පැළෑටි සිතියම් ගත කිරීම හා තොරතුරු දත්ත පද්ධතියක් සැකසීම අදියර 1 වැඩසටහන -2015.05.31



- **ආයුර්වේද පර්යේෂණායතනයේ ඖෂධ උයන හා පැළෑටි සිතියම් ගත කිරීම හා තොරතුරු දත්ත පද්ධතියක් සැකසීම අදියර 1 වැඩසටහන** - 2015.05.31

*ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ආර්.එම්.කේ.රත්නායක මහතා ඇතුළු කණ්ඩායම*





- **ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් පවත්වන ලද ඵලදායිතා ආරම්භක වැඩමුළුව** - 2015.06.11

*දේශන අංක **01***



*දේශන අංක **02***



- **ඖෂධ නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වැඩිදියුණු කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන පුහුණු වැඩමුළුව**

*ලින්ක් නැචුරල් කර්මාන්ත ශාලාව නැරඹීම, ගබඩා කළමණාකරු විසින් පවත්වන ලද දැනුවත් කිරීමේ දේශනය* ***-2015.06.12***






- **ඖෂධ නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වැඩිදියුණු කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන පුහුණු වැඩමුළුව**

*හල්දුම්මුල්ල ඔසු උයන දේශන* ***-2015.06.13***




*හල්දුම්මුල්ල ඔසු උයන දේශන -2015.06.14*





***2015 ආයුර්වේද එක්ස්පෝ ප්‍රදර්ශනය - 2015.07.04***










*ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් පවත්වන ලද ඵලදායිතා ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේ වැඩමුළුව ( අංක 01) - 2015.09.08*













- **සම්ප්‍රදායික දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම සහ සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය (රු. මිලියන 250)**

*2015 ජාතික සම්මන්ත්‍රණය - සමාරම්භක උළෙල 2015.10.16*



***2015 ජාතික සම්මන්ත්‍රණය - පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම 2015.09.18***











***2015 ඵලදායිතා වැඩසටහන යටතේ පැවැත්වූ ඵලදායිතා වැඩසටහන - වින්දනීය සැන්දෑව***







ලෝක දියවැඩියා දින වැඩසටහන - **2015.11.14**






ප්‍රමිතිකරණ විද්‍යාගාරය සඳහා මිලදී ගන්නා ලද ගෑස් සිලින්ඩර හා එය භාවිතා කිරීම




පුස්කොළ පොත් සංරක්ෂණ ව්‍යාපෘතිය යටතේ සංරක්ෂිත පත්තිරු



**සාම්ප්‍රදායික දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය සහ සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය (රු. මිලියන 250)**

| අංකය | දිනය | පවත්වන ලද ස්ථානය | වැඩසටහන | අදාළ කණ්ඩායම | ප්‍රතිඵලය | වියදම් වූ මුදල රු. |
|---|---|---|---|---|---|---|
| 1 | 2015.01.01 | BMARI | ව්‍යාධිවේදී රසායනාගාරය විදුලි සැපයුම ලබා ගැනීම | වෛද්‍ය ශිවකුමාරන් මයා | පර්යේෂණ සහ රෝගී සත්කාර සේවාවන් සඳහා විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කර ගැනීම | 20,119.00 |
| 2 | 2015.01.05 | BMARI | මහාචාර්ය ඊ.පි.එස්.චන්දන මහතා සමඟ පිළිකා පර්යේෂණ වැඩමුළුව | Cancer Group | ආයතනයේ පිළිකා සායනය හරහා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන සායනික හා සත්ත්ව පර්යේෂණ සිදුකරන ආකාරය සැලසුම් කිරීම | 3,440.00 |
| 3 | 2015.01.07 | BMARI | විද්‍යාගාර විශේෂඥ උපදේශන වැඩමුළුව | Cancer Group | | 6,135.00 |
| 4 | 2015.01.31 | කටුගස්තොට | අධ්‍යයන වැඩසටහන -කටුගස්තොට | Cancer Group | පිළිකා රෝගය සඳහා "SAASI " වෙද මැඳුරේ දේශීය වෛද්‍ය ක්‍රමයට සිදුකෙරෙන ප්‍රතිකාර ක්‍රම අධ්‍යයනය කිරීම | 7,100.00 |
| 5 | 2015.02.27 | BMARI | පර්යේෂණ හා සේවාවන් සඳහා විද්‍යාගාර උපකරණ භාවිතය පිළිබඳ වැඩමුළුව | | පර්යේෂණ සහ රෝගී සත්කාර සේවාවන් සඳහා විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කර ගැනීම | 11,990.00 |
| 6 | 2015.03.02 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | නවරත්න කල්කයේ විෂ සහිත තත්ත්වය පරික්ෂා කිරීම සඳහා මහාචාර්ය ශිරානි රණසිංහ මියට ඉතිරි මුදල් ගෙවීම | CKDU Group | | 53,150.00 |
| 7 | 2015.03.04 | BMARI | ජෛව සංඛ්‍යානය පිළිබඳ දේශනය - 02<br>සම්පත් දායක දීමනා | ආයතනයේ වෛද්‍යවරු | | 2,100.00 |
| 8 | 2015.04.07 | ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාලය | BMARI ලාංඡනය බුද්ධිමය දේපළ කාර්යාලයෙහි ලියාපදිංචි කිරීම සඳහා ගිය වියදම | | | 3,300.00 |
